2021

වාර්ෂික වාර්තාව

ජීවන කුසලතා සංවර්ධනය කරනු ලබන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය

ජාතික යොවුන් සේනාංකය

නොː 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
Tel/Fax : +94 112 684 784 / +94 112 688 885
E-mail: info@youthcorps.lk
Web: www.youthcorps.lk

දැක්ම හා මෙහෙවර

අපේ දැක්ම



ආසියානු කලාපය තුළ තාරුණ්‍යය සඳහා ජීවන කුසලතා සංවර්ධනය කරනු ලබන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

අපේ මෙහෙවර



දැනුම, නිපුණතා හා කුසලතාවයන්ගෙන් පරිපූර්ණ විනයගරුක, අභියෝගයන්ට නොසැලෙන ජවසම්පන්න තාරුණ්‍යය, ජීවන කුසලතා සංවර්ධනය තුළින් ගොඩනැංවීම සහ වෘත්තීය නිපුණත්වයට අවැසි කුසලතාවන්හි හිඩැස පිරවීම තුළින් ශ්‍රී ලාංකේය තාරුණ්‍යය සංවර්ධනයට දායක වීම.



අරමුණු

- යෞවන යෞවනියන්ගේ ජීවන කුසලතා සහ පෞරුෂත්ව සංවර්ධනය
- වෘත්තීය අධ්‍යාපනය ලබාදීම, වෘත්තීය පුහුණුව සහ රැකියා අවස්ථාවන්ට යොමු කිරීම

ප්‍රධාන කාර්යයන්

- ජාතික යොවුන් සේනාංක ජීවන කුසලතා පාඨමාලාව සඳහා යොවුන් ශිෂ්‍ය භටයින් බඳවාගැනීමට අදාළ කටයුතු සංවිධානය කිරීම හා බඳවාගැනීම.
- ජීවන කුසලතා පාඨමාලාව නිසි පරිදි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු තාක්ෂණ පාඨමාලාව හා ඉංග්‍රීසි භාෂා පාඨමාලාව මෙහෙයවීම.
- ජීවන කුසලතා පාඨමාලාව අවසන් කරන තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම හා රැකියාගත කිරීම.
- අභ්‍යන්තර පුහුණුලාභීන්/ලාභිනියන්ට අමතරව බාහිර පාර්ශ්වයන් සඳහා ජීවන කුසලතා පුහුණුව ලබාදීම.
- හෝටල් පාසල හා ඊට අදාළ පාඨමාලා පවත්වාගෙන යාම.
- යෞවන යෞවනියන්ගේ සෞන්දර්යාත්මක හා ක්‍රීඩා කෞශල්‍යයන් වැඩි දියුණු කිරීමට දායකත්වයක් සැපයීම.
- ආයතනය තුළ ඇති භෞතික සම්පත් පරිපාලනය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.



සභාපතිතුමාගේ පණිවුඩය

2021 වර්ෂය ජාතික යොවුන් සේනාංකය නව අත්හදා බැලීම් සඳහා යොමුකළ පර්යේෂණාත්මක වර්ෂයක් ලෙස හැඳින්වීම නිවැරදි යැයි සිතමි. 2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට සමස්ත ලෝකයත් සමඟම අප රට මුහුණදුන් කෝවිඩ් 19 වසංගතයේ උච්චතම අවධිය ලෙස 2021 වර්ෂයේ පළමු අඩවසර හඳුනාගත හැකිය. මේ හේතුවෙන් සමස්ත දිවයින පුරාම නිරෝධායන ඇඳිරිනීතිය පැනවීමත් වසංගතය සීඝ්‍රයෙන් පැතිරී යන ප්‍රදේශ හඳුනාගනිමින් අගුළු දැමීමත් (Lock down), සංචරණ සීමා පැනවීමත්, සෞඛ්‍ය මාර්ගෝපදේශ මඟින් ජනතාව ඒකරාශි වීම වැළැක්වීම සඳහා පුහුණු කටයුතු වැනි සාමූහික ක්‍රියාකාරකම් සඳහා සීමා පැනවීමත් හේතුවෙන් 2021 වසරේදී ජාතික යොවුන් සේනාංකයේ පුහුණු කටයුතු සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

නමුත් ජාතික යොවුන් සේනාංකය 2020 වසරේදී උගත් පාඩම් සැලකිල්ලට ගෙන 2021 වර්ෂයේ අභියෝගයන් ජය ගැනීමට පහත සඳහන් ක්‍රමෝපායයන් අනුගමනය කරන ලදී.

අ. ජීවන කුසලතා පුහුණුවේ හඳුනාගත් විෂය කොටස් මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ පුහුණුලාභීන් වෙත බෙදාහැරීම.

ආ. තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රීසි විෂය හැදෑරීමට මාර්ගගත ක්‍රමවේදයන් මඟින් පුහුණුලාභීන් වෙත පහසුකම් සපයාදීම.

ඇ. නිවසේ සිට ජීවන කුසලතා ප්‍රගුණ කිරීමට හැකිවන පරිදි පුහුණුලාභීන්ගේ දායකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන සමාජය සවිබල ගැන්වීමේ වැඩසටහන් මාලාවක් හඳුන්වාදීම.

විශේෂයෙන් 2021 වර්ෂයෙදී තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි විෂය ඉගැන්වීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක් වූ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය සමඟ අනුබද්ධිතව ක්‍රියාත්මක කරන ලද අතර ඒ ආයතනය සතු ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය මඟින් (Learning Management System – SIBA Black Board) මෙම සේනාංකයේ පුහුණුලාභීන්ට පහසුකම් සපයා දෙන ලදී. ඒ අනුව මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ ඉගැන්වීම් කටයුතු සඳහා පුහුණුලාභීන් 1787 දෙනෙකුට නිදහස් දත්ත (Free Data) සඳහා Data SIM නොමිලේ ලබාදීමට කටයුතු කෙරිණි.

ජීවන කුසලතා විෂය සන්ධාරය තුළ වූ ඇතැම් කරුණු මාර්ගගත ක්‍රමවේදයන් මඟින් පුහුණුලාභීන් වෙත යොමු කිරීම දුෂ්කර වුවත් (විශේෂයෙන් ප්‍රායෝගික විෂය කොටස්) පවතින සම්පත් භාවිත කරමින් ඒ සඳහා ද විකල්ප ක්‍රම අත්හදා බැලීමට සේනාංකයේ පුහුණු මධ්‍යස්ථානවල උපදේශක මණ්ඩලය ක්‍රියා කිරීම ද අගය කළ යුතු කරුණකි.

විශේෂයෙන් පුහුණුලාභීන්ට ජීවන කුසලතා පුහුණු කළ හැකි පරිදි පහත සඳහන් වැඩසටහන් තම නිවස ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මගපෙන්වීම් මාර්ගගත ක්‍රමවේදයන් මඟින් සිදුකරන ලද අතර කෝවිඩ් වසංගත කාලසීමාව තුළ තරුණයන් නිකරුණේ හා මානසික පීඩනයක් සහිතව නිවසේ රැඳී සිටීම වළක්වාලීමට ඔවුන් ක්‍රියාකාරකම්හි නිරත කිරීම මඟින් අත්දැකීම් ලබාගනිමින් ජීවිතය වින්දනය කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

- 'සත්ත්ව මිතුරු සත්කාරය' - මාර්ගයේ හෝ කඩපිළේ යනාදී පොදු ස්ථානයන්හි අසරණව හා ගිලන්ව සිටින සතුන් සඳහා ආහාරපාන ආදිය ලබාදීම හා රැකබලා ගැනීම සඳහා වූ වැඩසටහනකි.
- Y – Green කෘෂි වගා වැඩසටහන - පුහුණු මධ්‍යස්ථාන මට්ටමින් සහ පුහුණුලාභීන්ගේ ගෙවතු ආශ්‍රිත වගා වැඩසටහනකි.
- 'සුසුමට සවියක්' ආපදා සංවර්ධන වැඩසටහන - ස්වාභාවික හෝ වෙනත් ආපදාවකදී ස්වේච්ඡාවෙන් සංවිධානාත්මකව ඉදිරිපත් වී ආපදාවට ලක්වූවන්ට සහන සැලසීම සඳහා වූ වැඩසටහනකි.
- 'ජීවිතයට ජීවයක්' ලේ දන්දීමේ වැඩසටහන - රෝහල් ක්ෂේත්‍රයේ ඉල්ලුම පරිදි ප්‍රජා සහභාගිත්වය ද සහිතව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනකි.
- ජාතික සංහිඳියා තරුණ හුවමාරු වැඩසටහන - ජාතීන් අතර මිත්‍රත්වය, සුහදත්වය, සහෝදරත්වය ගොඩනැගීම සඳහා වූ සංස්කෘතික වැඩසටහනකි.

එසේම පුහුණුලාභීන්ගේ අත්දැකීම් පරාසය පුළුල් කර ගැනීම, සමාජය සමඟ ගනුදෙනු කිරීමේ කලාව ප්‍රගුණ කිරීම, ආකල්ප සංවර්ධනය හා ජාතික සේවය පිළිබඳ හැඟීම් උද්දීපනය කරමින් සරණක් අවැසි අඩුආදායම්ලාභී පවුලක් වෙත නිවසක් ඉදිකරදීමේ අරමුණින් ක්‍රියාවට නංවන ලද 'සෙනෙහෙ පියස' නිවාස සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දීප ව්‍යාප්තව පිහිටා ඇති ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන 55 මඟින් එක් නිවසක් බැගින් නිවාස 55 ක් ඉදිකරදීමේ සමාජ සත්කාරක වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීමට හැකි වීම පිළිබඳව සතුටට පත්වෙමි.

වැල්ලවාය, නුවරඑළිය, ගම්පොළ යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන හා දඹුල්ල හෝටල් පුහුණු පාසල ඇතුළු ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන කොරෝනා රෝගීන්ගේ ප්‍රතිකාර සහ නිරෝධායන මධ්‍යස්ථාන වෙනුවෙන් ලබාදීම ජාතික අවශ්‍යතාවයකදී ජාතික යොවුන් සේනාංකයේ උපරිම කැපවීම, සංවිධාන ශක්තිය පිළිඹිබු කළ අවස්ථාවක් විය. තවද පුහුණු මධ්‍යස්ථාන අංග සම්පූර්ණ ප්‍රතිකාර මධ්‍යස්ථාන බවට පත් කිරීමේ දී යෞවන යෞවනියන්, කාර්ය මණ්ඩලය, දෙමව්පියන් ඇතුළු ප්‍රදේශවාසීන් දැක්වූ සහයෝගය බෙහෙවින් අගයමි.

පැවැති වසංගත තත්ත්වය හමුවේ කොරෝනා රෝගීන් හට ප්‍රතිකාර කිරීමේදී රෝහල් තුළ පුරප්පාඩුවක්ව පැවැති ඇඳන් 10,000 ක් රෝහල් පද්ධතියට සපයාදීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරන ලද දින 10 න් ඇඳන් 10,000 ක් ව්‍යාපෘතිය දින 06 ක් වැනි කෙටිකාලයකදී ඉතා සාර්ථක අන්දමින් සම්පූර්ණ කිරීමට හැකියාව ලැබීම ජාතිය හමුවේ අප යුතුකම සහ වගකීම මැනැවින් ඉටුකිරීමකි.



කෙසේ නමුත් කෝවිඩ් 19 වසංගතය මැද වුවද තරුණ පරපුර ජීවන කුසලතාවලින් පොහොසත් කිරීම සඳහාත් රටට හා ජාතියට හිතැති සමාජශීලී පිරිසක් බවට පරිවර්තනය කිරීම සඳහාත් සැලකිය යුතු වැඩකොටසක් වර්ෂය තුළ ඉටු කිරීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි. ඒ සඳහා දැක්වූ සහයෝගය සහ කළ කැපකිරීම් වෙනුවෙන් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයටත් ජාතික යොවුන් සේනාංකයේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කාර්යය මණ්ඩලයේ සියලුදෙනාටත් මාගේ ස්තූතිය පුද කරමි.

2022 වර්ෂය තවදුරටත් ශ්‍රී ලාංකික තාරුණ්‍යය සවිබල ගන්වමින් සමෘද්ධිමත් අනාගතයක් උදෙසා මෙහෙයවීමට ශක්තිය ධෛර්යය ලැබෙන සුබ වසරක් වේවායි! ප්‍රාර්ථනය කරමි.

කර්නල් දර්ශන රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
සභාපති
ජාතික යොවුන් සේනාංකය

පටුන

දැක්ම

මෙහෙවර

අරමුණු සහ කාර්යයන්

සභාපතිතුමාගේ පණිවුඩය

1. ජාතික යොවුන් සේනාංකය

1.1 යොවුන් සේනාංකයේ පාලනය

1.2 යොවුන් සේනාංක සභාව

2. ආයතනික ව්‍යුහය

2.1 අධ්‍යක්ෂ /සභාපති

2.1.1 යොවුන් සේනාංක අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අංශ

2.1.2 අධ්‍යක්ෂ මණ්ඩලය

2.2 ජාතික යොවුන් සේනාංක තූර්යවාදක කණ්ඩායම

2.3 සංවිධාන ව්‍යුහය

3. පළාත් හා පුහුණු මධ්‍යස්ථාන ජාලය

3.1 පළාත් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථාන

3.2 පුහුණු මධ්‍යස්ථාන සිතියම

3.3 පුහුණු මධ්‍යස්ථානයක පවත්නා පහසුකම්

4. ප්‍රගති සමාලෝචනය

4.1 ජීවන කුසලතා පුහුණුව (යෞවන යෞවනියන් පුහුණු කිරීම)

4.1.1 තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව

4.1.2 වෘත්තීය පුහුණුවට යොමු කිරීම්

4.1.3 හෝටල් පුහුණු පාඨමාලාව

4.2 විශේෂ ජීවන කුසලතා සංවර්ධන වැඩසටහන්

4.3 තරුණ සංවර්ධන වැඩසටහන්

4.4 ධීර අභ්‍යාස පුහුණුව

4.5 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

4.6 ප්‍රාග්ධන ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය

4.7 පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය

4.7.1 පුනරාවර්තන සංවර්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය

4.7.2 ප්‍රාග්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය

4.8 මූල්‍ය නොවන වත්කම්

4.9 පරිපාලනය හා කාර්ය මණ්ඩලය පිළිබඳ සමස්ථ සටහන

4.10 ඉදිරි ඉලක්ක

4.11 2021 වසරේ ජයග්‍රහණ

5. මානව සම්පත් සංවර්ධනය

5.1 මානව සම්පත් සංවර්ධන අංශය මඟින් පවත්වන ලද විවිධ පුහුණු වැඩසටහන්

5.2 පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්

5.3 අනෙකුත් කාර්යය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන්

5.4 කාර්යය මණ්ඩලය සඳහා විදේශීය පුහුණු අවස්ථා

6. මූලික පුහුණු පාඨමාලාව

7. පුහුණු පාඨමාලාව අවසානයේ පුහුණුලාභීන් විසිරයෑම

8. වෘත්තීය පුහුණුවට යොමු කිරීම

9. විශේෂ පුහුණු පාඨමාලා

9.1 හෝටල් පුහුණු පාඨමාලාව

9.2 බැහැරගත පුහුණු පාඨමාලාව

10. තරුණ සංවර්ධන වැඩසටහන්

10.1 පාසල් ශිෂ්‍ය නායකයින් පුහුණු කිරීම

10.2 බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා වැඩසටහන

10.3 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

10.4 නව යොවුන්විය සෞඛ්‍ය හා ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ වැඩසටහන

10.5 බෝ නොවන රෝග පිළිබඳ වැඩසටහන

10.6 රචනා තරඟාවලිය

10.7 විවාද තරඟාවලිය

10.8 දැනුම මිනුම තරඟාවලිය

10.9 ආපදා කළමනාකරණ වැඩසටහන

10.10 ක්‍රීඩා උලෙළ (පළාත්)

10.11 පරිසර ව්‍යාපෘතිය

10.12 ප්‍රජා සංවර්ධන වැඩසටහන

10.13 තරුණ සංවර්ධන වැඩසටහන් සාරාංශය (ක්ෂේත්‍රය අනුව)

11. සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන්

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

විගණකාධිපති වාර්තා

විගණකාධිපති වාර්තා පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ

1. ජාතික යොවුන් සේනාංකය

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික යොවුන් සේනාංකය තරුණ සංවර්ධනය, රැකියා පුහුණුව හා වෘත්තීය අධ්‍යාපනය අරමුණු කොට ගෙන 2002 අංක 21 දරණ පාර්ලිමේන්තු පනතින් සංස්ථාපනය කරන ලද ජාතික ආයතනයකි.

මේ වන විට ජාතික යොවුන් සේනාංකය දිවයිනේ "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව සමඟ බද්ධ වෙමින් තරුණ සංවර්ධනය සඳහා "ජීවන කුසලතා පුහුණුව" ලබාදෙන විකම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කරමින් සිටී. පවතින අධ්‍යාපන ක්‍රමයේ තරගකාරී ස්වභාවය සමඟ බද්ධ වන අනෙකුත් සමාජ සංසිද්ධීන් තරුණයා තුළ ජීවන කුසලතා ගොඩනැංවීම අධෛර්යමත් කර ඇත. එබැවින් තරුණයාගේ සමෘද්ධිමත් අනාගතය සඳහා වූ අභිලාෂයන් අනාගත වැඩලෝකය සහ ඊට ගැලපෙන ජීවන කුසලතා තරුණයා වෙත සම්ප්‍රේෂණය කිරීම ජාතික යොවුන් සේනාංකයේ මූලික කාර්යභාරය ලෙස හඳුනාගෙන තිබේ.

මෙම ජාතික කර්තව්‍ය ඉටුකිරීම සඳහා සේනාංකය කොළඹ පිහිටි මෙහෙයුම් මූලස්ථානයකින් ද, පළාත් නවය කේන්ද්‍ර කොටගත් පළාත් කාර්යාල 09 කින් ද පුහුණු මධ්‍යස්ථාන 55 ක ජාලයකින් ද යුක්ත වේ.

ජාතික යොවුන් සේනාංකයේ මූලික පාඨමාලාව කොටස් දෙකකින් සමන්විත වේ. පළමු ත්‍රෛමාසිකය ජීවන කුසලතා පුහුණුව සඳහා වෙන් කර ඇත. දෙවන ත්‍රෛමාසිකය තුළ තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙනු ලබයි. මෙහිදී පරිගණක තාක්ෂණය මෙන්ම ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ නිපුණතාවය තරුණයා තුළ ගොඩනැංවීම සිදුකරයි.

ජීවන කුසලතා පාඨමාලාව සාර්ථකව අවසන් කරන යොවුන් ශිෂ්‍යභටයන්ට වෘත්තීය මාර්ගෝපදේශ ක්‍රම විද්‍යාවට අනුව ඒ ඒ තරුණයාගේ දක්ෂතා හැකියා හා රුචිකත්වය පදනම් කොටගෙන සුදුසු වෘත්තීය පුහුණුවක් සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක් වෙත යොමු කරනු ලැබේ. මෙහිදී මූලික පාඨමාලාවේ ඉහළ සාධනයන් පෙන්නුම් කරමින් දක්ෂතා පෙන්වන තරුණ තරුණියන්ට රුපියල් ලක්ෂයක් දක්වා වූ වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් ප්‍රදානය කෙරේ. එමෙන්ම මූලික පාඨමාලා ද්විත්වය සම්පූර්ණ කරන සියලු යොවුන් ශිෂ්‍යභට / භටවියන්ට වෘත්තීය පුහුණුවක් ලබා ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම, යොමු කිරීම හා පහසුකම් සැපයීම ජාතික යොවුන් සේනාංකය මඟින් ඉටුකරනු ලබයි.

ජීවන කුසලතා පුහුණුව ලබාදෙන මධ්‍යස්ථානවලට අතිරේකව ජාතික යොවුන් සේනාංකය විසින් හෝටල් පුහුණු පාසල දඹුල්ල ප්‍රදේශයේ ස්ථාපිත කොට ඇත. මූලික පාඨමාලාව හදාරා අවසන් කරන පුහුණුලාභීන් සහ ඉඳුරාම හෝටල් ක්ෂේත්‍රය සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයින් සඳහා හෝටල් පුහුණු පාසල මඟින් පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි. ඉඳුරාම පාඨමාලාවට සහභාගි වන පුහුණුලාභීන් සඳහා හෝටල් පුහුණු පාඨමාලාවට සමගාමීව මූලික ජීවන කුසලතා පුහුණුවක් ලබාදෙනු ලැබේ.

රටේ ජාතික නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා වැඩලෝකය තුළ කාර්යක්ෂමතාවය ඉතා අත්‍යවශ්‍ය කාරණයක් වන අතර, ඒ සඳහා පුද්ගලයා තුළ ජීවන කුසලතා සංවර්ධනය අනිවාර්යය සාධකයකි. සාමාන්‍ය අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය අවසන් කොට රැකියා වෙළෙඳපොළට ප්‍රවේශ වන සියලුදෙනාටම ජාතික යොවුන් සේනාංකයේ ජීවන කුසලතා පුහුණුව අවසානයේ රැකියාගත කිරීම මඟින් අපේක්ෂිත වැඩපොළ කාර්යක්ෂමතාවය අත්පත් කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. 2021 වසරෙන් ඉදිරියට ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ජාතික යොවුන් සේනාංකයේ ඉදිරි සැලසුම් සකස් වෙමින් පවතී.

2021 වසරේදී දේශීයව හා ගෝලීයව මුහුණදුන් කෝවිඩ් 19 වසංගතයත් සමඟ ජීවන කුසලතා පුහුණු වැඩසටහන් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීම ගැටලුවක් වුවද එය අභියෝගයක් ලෙස සලකමින් මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදයන් ඔස්සේ වැඩසටහන් මෙහෙයවීමට හැකියාව ලැබුණි. එම කාලසීමාව තුළ උගත් පාඩම් තවදුරටත් මෙරට තරුණ සංවර්ධනය සඳහා ක්‍රියාකාරිව යෙදවීමට ද ජාතික යොවුන් සේනාංකය සූදානමින් සිටී.



1.1 ජාතික යොවුන් සේනාංකයේ පාලනය

2002 අංක 21 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කර ඇති ජාතික යොවුන් සේනාංකය තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුත් සභාවක් මඟින් පාලනය වේ.

1.2 යොවුන් සේනාංක සභාව

ජාතික යොවුන් සේනාංක සභාව යොවුන් සංවර්ධනය, සේවා නියුක්තිය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල දැනුම සහ පළපුරුද්ද ඇති තෝරාගත් සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ. එහි එක් අයකු කාන්තා නියෝජනයක් විය යුතුය. තවද අමාත්‍යවරයා විසින් එම සාමාජිකයින් 05 දෙනා අතරින් එක් සාමාජිකයකු සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු බව යොවුන් සේනාංක පනතේ දෙවන වගන්තියේ සඳහන් වේ. සාමාජිකයින්ගේ ධුර කාලය වසර 03 කි.

සභාව පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

අ. ජාතික යොවුන් සේනාංකය සඳහා සැලසුම් හා වැඩපිළිවෙළ සකස් කිරීම.

ආ. සම්පාදනය කරන ලද වැඩපිළිවෙළ අනුව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සැලසුම් හා වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව නියාමනය කිරීම සහ ඒ පිළිබඳව වාර්තා කිරීම.

ඇ. යොවුන් සේනාංක සාමාජිකයන්ගේ පුහුණුව අධීක්ෂණය කිරීම.

ඈ. යොවුන් සේනාංක අධ්‍යක්ෂකවරයා විමසා සේනාංකයේ සාමාජිකයින්ගේ පුහුණුවට සහ කාර්යක්ෂමතාවයට අදාළ කොන්දේසි සහ පුහුණු වන්නා විසින් අත්කර ගැනීමට නියමිත නිපුණතාවයේ ප්‍රමාණය නිශ්චිතව දැක්වීම.

2021 වර්ෂයේ ජාතික යොවුන් සේනාංක සභාවේ සාමාජිකයින්

චන්ද්‍රරත්න පල්ලේගම මහතා - **සාමාජික**
අතිරේක ලේකම්(පාලන හා ප්‍රසම්පාදන), තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

ආචාර්ය චාමින්ද අබේසිංහ මහතා - **සාමාජික**
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය)

ආචාර්ය ඊ.ඒ.ඩී. අනූෂා එදිරිසිංහ මහත්මිය - **සාමාජික**
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය)

එම්.ඒ.එම්.සී.එස්. සිරිවර්ධන මහතා - **සාමාජික**

අසංක මෛත්‍රීරත්න මහතා - **සාමාජික**
භාණ්ඩාගාර නියෝජිත

එම්.ආර්.වී.ආර්. මීපුර මහතා - **සාමාජික**
භාණ්ඩාගාර නියෝජිත
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(වැ.බ)
රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

ටනේෂ් බර්නාර්ඩ් ඩයස් මහතා - **සාමාජික**
මානව සම්පත් ප්‍රධානී
ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය

2. ආයතනික ව්‍යුහය

ජාතික යොවුන් සේනාංකය යොවුන් සේනාංක මූලස්ථාන කාර්යාලයක්, පළාත් කාර්යාල 09 ක්, පුහුණු මධ්‍යස්ථාන 55 ක්, බැහැරගත පුහුණු මධ්‍යස්ථානයක් සහ හෝටල් පුහුණු පාසලකින් සමන්විත වේ.

ජාතික යොවුන් සේනාංකය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂකවරයා ඇතුළු කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇති අතර එය ස්ථිර කාර්ය මණ්ඩලයක් හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය ත්‍රිවිධ හමුදාවේ සේවය කර නීත්‍යානුකූලව ඉවත් වූ හෝ විශ්‍රාම ලබා ගත් අයවලුන්ගෙන් සමන්විත වන අතර ද්විතීයික පදනම මත බලකායේ රාජකාරි සඳහා ජාතික ශිෂ්‍යභට බලකායේ නිලධාරීන් ද ඇතුළත් කරගෙන ඇත.

2.1 අධ්‍යක්ෂ/සභාපති

සේනාංකයේ අධ්‍යක්ෂකවරයා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර සේනාංකයේ පරිපාලනය, පුහුණුව, විනය කටයුතු සහ කාර්යක්ෂමතාව පිළිබඳ පූර්ණ වගකීම උසුලනු ලබයි.

අධ්‍යක්ෂකවරයා විසින්,

අ) සභාවේ තීරණ බලාත්මක කළ යුතු අතර

ආ) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද කාර්ය ඉටුකිරීම සඳහා ද සභාවට අවශ්‍ය තොරතුරු සභාවට සැපයිය යුතුය

යනුවෙන් පනතේ 08 වන වගන්තියේ සඳහන් වේ.

2.1.1 යොවුන් සේනාංක අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අංශ

යොවුන් සේනාංක සභාවේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යෑමේ අරමුණින් නීති, අභ්‍යන්තර විගණන යන අංශ යොවුන් සේනාංක අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

සභාලේකම් / නීති නිලධාරි

යොවුන් සේනාංක සභාව රැස්කිරීම ඒ ඒ අංශ වෙතින් ඉදිරිපත් කරන සභා පත්‍රිකා සභාව වෙත ඉදිරිපත් කිරීම, සභාව විසින් අනුමත කරනු ලැබූ සභා පත්‍රිකා ගනු ලැබූ තීරණ අදාළ අංශ හා නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම, සභාවේ සටහන් ලබා ගැනීම ඇතුළු සියලු සභා සාමාජිකයන් සම්බන්ධීකරණ කටයුතු හා යොවුන් සේනාංකය වෙනුවෙන් වන සියලුම නීතිමය හා අධිකරණමය කටයුතු සහ එම කටයුතුවලදී යොවුන් සේනාංකය වෙනුවෙන් පෙනී සිටීම ආදිය සිය කාර්ය මණ්ඩලයේ සේවා දායකත්වය සමඟින් අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.

අභ්‍යන්තර විගණන අංශය

යොවුන් සේනාංක අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ වූ කාර්ය මණ්ඩලයකින් සමන්විත අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වන අතර මෙමඟින් යොවුන් සේනාංක මූලස්ථානයේ හා සියලුම පුහුණු මධ්‍යස්ථානයන්හි විගණන කටයුතු සිදුකර විගණන විමසුම් ඉදිරිපත් කිරීම සිදුකරනු ලබයි.

2.1.2 අධ්‍යක්ෂ මණ්ඩලය

යොවුන් සේනාංක මූලස්ථානය සභාපති/අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂකවරු 02 ක්, සහකාර අධ්‍යක්ෂකවරු 05 ක් හා සභා ලේකම්/නීති නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. එසේම 2016 වසරේදී තාවකාලික පදනම මත වසර 03 ක කාලයක් සඳහා අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ලෙස තනතුරු 02 ක් ජාතික යොවුන් සේනාංක මූලස්ථානය සඳහා අනුමතව ඇත. ඒ අනුව යොවුන් සේනාංක මූලස්ථානයේ ක්‍රියාත්මක අංශ පහත පරිදි වේ.

අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය)

පාලන අංශය - සහකාර අධ්‍යක්ෂ(පාලන)

සහකාර අධ්‍යක්ෂ (පාලන) යටතේ මානව සම්පත් ඒකකයක්, ප්‍රසම්පාදන ඒකකයක්, ප්‍රවාහන ඒකකයක් හා ඉදිකිරීම් සහ නඩත්තු ඒකකයක් ක්‍රියාත්මක වන අතර මේ සඳහා පරිපාලන නිලධාරී, කාර්මික නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ සහකාර ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදු කරයි. කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම, බඳවා ගැනීම, ස්ථාන මාරු සිදු කිරීම ඇතුළු මානව සම්පත් සංවර්ධන කටයුතු, මූලස්ථානයේ හා පුහුණු මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු පුහුණු පාඨමාලාව පවත්වාගෙන යෑමට අවශ්‍ය පහසුකම් සැපයීම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

මූල්‍ය අංශය - සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) යටතේ ගිණුම් ඒකකයක්, මූල්‍ය ඒකකයක් හා ගබඩා ඒකකයක් ක්‍රියාත්මක වන අතර මේ සඳහා ගබඩා නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදුකරයි. කාර්යයමණ්ඩල වැටුප් හා දීමනා ඇතුළු සියලු ගෙවීම් කටයුතු, ගිණුම් කටයුතුවලට අදාළ සියලු ලේඛන නඩත්තුව හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම, පුහුණු මධ්‍යස්ථාන වෙත අවශ්‍ය බඩුභාහිරාදිය බෙදාහැරීම ඇතුළු සියලු ගබඩා කටයුතු පවත්වාගෙන යෑම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)

පුහුණු අංශය - සහකාර අධ්‍යක්ෂ(පුහුණු)

සහකාර අධ්‍යක්ෂ(පුහුණු) යටතේ පුහුණු අංශය හා වෘත්තීය පුහුණු සහ NVQ ඒකක ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදුකරයි. පුහුණු මධ්‍යස්ථානයන් හි පවත්වනු ලබන මූලික පුහුණු පාඨමාලාවේ සියලු කටයුතු බාහිර ආයතන හා පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා ධාරිතා සංවර්ධන හා නායකත්ව වැඩමුළු මෙහෙයවීම, උපදේශක හා කාර්යය මණ්ඩල පුහුණුව පුහුණු අංශය මඟින් මෙහෙයවනු ලබයි.

සංවර්ධන අංශය - සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)

සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) යටතේ සංවර්ධන අංශය ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදුකරයි. පුහුණු මධ්‍යස්ථානයන්ට පුහුණුලාභීන් බඳවා ගැනීම, පුහුණු කාලය තුළ පවත්වන කලා උලෙළ, ක්‍රීඩා උලෙළ, දැනුම මිනුම තරඟ, ප්‍රජා සත්කාරක වැඩසටහන් ආදී විවිධ වැඩසටහන් සංවිධානය කිරීම, පුහුණුලාභීන්ගේ විසාරයෑමේ පෙළපාළි කටයුතු, සහතිකපත් නිකුත් කිරීම් කටයුතු ජීවන කුසලතා පාඨමාලාව අවසන් කරන පුහුණුලාභීන් වෘත්තීය පුහුණුවට යොමු කිරීම හා සම්බන්ධීකරණය මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

මෙහෙයුම් අංශය - සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)

සහකාර අධ්‍යක්ෂ - (මෙහෙයුම්) යටතේ තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය ඒකක ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදුකරයි. මූලස්ථානය හා සියලුම මධ්‍යස්ථාන ජාල ගත කර ජාලයක් ලෙස පවත්වා ගෙන යෑම, යොවුන් සේනාංක වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගෙන යෑම, මූලස්ථානයේ හා මධ්‍යස්ථානයන් හි තොරතුරු තාක්ෂණ අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම, යොවුන් සේනාංකයේ සියලු මාධ්‍ය අවශ්‍යතා සපුරාලීම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)

2016 වර්ෂයේදී ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතියේ රාජකාරී කටයුතු සඳහා තාවකාලික පදනම මත වසර 03 ක කාලයක් සඳහා අතිරේක අධ්‍යක්ෂ(සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ(සැලසුම්) ලෙස තනතුරු 02 ක් 2016 සැප්තැම්බර් මාසයේදී අනුමත කර ගනු ලැබූ අතර ඒ සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි 2016 නොවැම්බර් මාසයේදී අනුමත කර ගන්නා ලදී. 2017 වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂ(සැලසුම්) තනතුරු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියකු ද්විතීය පදනම මත බඳවා ගන්නා ලද අතර නව මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු ඔහුගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදී. 2021 වර්ෂයේදී ජාතික ශිෂ්‍යභට බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු විසින් සැලසුම් අධ්‍යක්ෂ රාජකාරීන් ආවරණය කරනු ලබයි.

2.2 ජාතික යොවුන් සේනාංක තූර්යවාදක කණ්ඩායම

සියලුම නවින තූර්ය වාදක භාණ්ඩයන්ගෙන් සමන්විත බටහිර තූර්යවාදක කණ්ඩායමක් ජාතික යොවුන් සේනාංකය සතුවන අතර ත්‍රිවිධ හමුදාවේ තූර්යවාදන කණ්ඩායම්හි සාමාජිකත්වය දරා විශ්‍රාම යාමෙන් අනතුරු යොවුන් සේනාංකයේ සරඹ උපදේශක තනතුරු සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් මෙහි වාදකයින් ලෙසට කටයුතු කරනු ලබයි.

යොවුන් සේනාංක පුහුණුලාභීන්ගේ විසිරයෑමේ පෙළපාලි ඇතුළු උත්සව සඳහා මෙම තූර්යවාදක කණ්ඩායම යොදා ගන්නා අතර ජාතික නිදහස් දින පෙළපාළියට ද යොවුන් සේනාංක පුහුණුලාභීන් සමඟ මෙම තූර්යවාදක කණ්ඩායම සහභාගි වේ. මෙම තූර්යවාදක කණ්ඩායම පුහුණු මධ්‍යස්ථානයන්හි සෙසු උපදේශක රාජකාරීන්හි ද යොදවා ඇත.



2021 වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය

තනතුර	වැටුප් කේතය	අනුමත කාර්ය මණ්ඩලය				
		ස්ථිර	කොන්ත්‍රාත්	තාවකාලික	පුරප්පාඩු	අතිරික්ත
ස්ථිර						
අධ්‍යක්ෂ	HM 1 - 3	1				
අතිරේක අධ්‍යක්ෂ(පරිපාලන හා මූල්‍ය)	HM 1 - 1	1				
අතිරේක අධ්‍යක්ෂ(පුහුණු හා සංවර්ධන)	HM 1 - 1	1				
සහකාර අධ්‍යක්ෂ(පාලන)	MM 1 - 1	1			1	
සහකාර අධ්‍යක්ෂ(පාලන)	MM 1 - 1	1				
සහකාර අධ්‍යක්ෂ(පුහුණු)	MM 1 - 1	1				
සහකාර අධ්‍යක්ෂ(සංවර්ධන)	MM 1 - 1	1				
සහකාර අධ්‍යක්ෂ(මෙහෙයුම්)	MM 1 - 1	1				
සභා ලේකම් / නීති නිලධාරී	MM 1 - 1	1				
සැලසුම් සම්බන්ධීකරණ නිලධාරී	JM 1 - 1			1	1	
අභ්‍යන්තර විගණන නිලධාරී	JM 1 - 1	1				
පරිපාලන නිලධාරී	JM 1 - 1	1				
ගබඩා නිලධාරී	JM 1 - 1	1				
කාර්මික නිලධාරී	JM 1 - 1	1				
පරිපාලන නිලධාරී (මානව සම්පත්)	JM 1 - 1	1				
ප්‍රසම්පාදන නිලධාරී	JM 1 - 1	1				
ප්‍රවාහන නිලධාරී	JM 1 - 1	1				
ගිණුම් නිලධාරී	JM 1 - 1	1				
ජාල පරිපාලන නිලධාරී	JM 1 - 1	1				
සංවර්ධන සහකාර	MA 3	160			11	
සෞන්දර්ය උපදේශක	MA 1 - 1	20			3	
කළමනාකරණ සහකාර	MA 1 - 1	102		1	4	
දෙමළ භාෂා පරිවර්ථක	MA 1 - 1	6			5	
උපදේශක (දෙමළ)	MA 1 - 1	57			24	
උපදේශක (තොරතුරු තාක්ෂණ)	MA 1 - 1	59			5	
උපදේශක (ඉංග්‍රීසි)	MA 1 - 1	58			11	
සරඹ/විනය උපදේශක	MA 1 - 1	88			4	
රියදුරු	PL 3	7		1		
පණිවිඩකරු	PL 3	1				
විදුලි කාර්මික	PL 3	1				
කාර්යාල සහායක	PL 1	33		1	3	
ගබඩාකරු	PL 1	39			3	

තනතුර	වැටුප් කේතය	අනුමත කාර්ය මණ්ඩලය		
		ස්ථිර	කොන්ත්‍රාත්	තාවකාලික
කොන්ත්‍රාත්				
සහකාර අධ්‍යක්ෂ(පළාත්)	MM 1 - 1		9	
මධ්‍යස්ථානාධිපති	JM 1 - 1		58	
සහාය මධ්‍යස්ථානාධිපති	JM 1 - 1		59	
උපදේශක(සරඹ)	MA 1 - 1		171	
එකතුව		649	297	4
		950		

2.3 සංවිධාන ව්‍යුහය



Add. Dir (Admin & Fin.)	Additional Director (Administration & Finance)
Add. Dir (Trg & Dev)	Additional Director (Training & Development)
Ass. Dir (Admin)	Assistant Director (Administration)
Asst. Dir (Fin)	Assistant Director (Finance)
Asst. Dir (Trag)	Assistant Director (Training)
Ass. Dir (Dev)	Assistant Director (Development)
Asst. Dir (Op)	Assistant Director (Operation)
Cou. Sec/Leg. Off.	Council Secretary/Legal Officer

Ass. Dir (Pro.)	Assistant Director (Province)
AO	Administrative Officer
TO	Technical Officer
AO HR	Administrative Officer (HR)
Tra. Off	Transport Officer
Pro. Off	Procurement Officer
Acc. Off.	Account Officer
NA	Network Administrator

OIC	Officer in Charge
Asst. OIC	Assistant Officer in Charge
Pl.Co. Officer	Planning/Coordinating Officer
DA	Development Assistant
MA	Management Assistant
TT	Tamil Translator
IT	Information Technology Instructor
EI	Esthetic Instructor

TI	Tamil Instructor
DI	Drill Instructor
DDI	Drill/Disciplinary Instructor
NYC	National Youth Coordinator
DR	Driver
EL	Electrician
OA	Office Aide
SM	Store Man

3. පළාත් හා පුහුණු මධ්‍යස්ථාන ජාලය

ජාතික යොවුන් සේනාංක මූලස්ථානය කේන්ද්‍ර කර ගනිමින් ජාතික යොවුන් සේනාංකයට අයත් පුහුණු මධ්‍යස්ථාන 55 ක දී යොවුන් ශිෂ්‍යභටයින් පුහුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක වේ. පුහුණු මධ්‍යස්ථාන පළාත් වශයෙන් විසිරී ඇති ආකාරය පහත පරිදි වේ.

පළාත	පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව
බස්නාහිර	05
මධ්‍යම	06
දකුණ	09
වයඹ	08
නැගෙනහිර	07
උතුර	03
ඌව	06
උතුරු මැද	05
සබරගමුව	06
එකතුව	**55**

ජාතික යොවුන් සේනාංක මූලස්ථානය යටතේ පළාත් කාර්යාල 09 ක් ක්‍රියාත්මක අතර පළාත් කාර්යාල 09 අධීක්ෂණය යටතේ මධ්‍යස්ථාන 55 ක් ක්‍රියාත්මක වේ.



3.1 පළාත් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථාන

පළාත් කාර්යාල

අනු අංකය	පළාත් කාර්යාල	ලිපිනය	දුරකථන අංකය
1	**බස්නාහිර**	බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වැරැල්ලවත්ත යක්කල.	0701278220
2	**මධ්‍යම**	මධ්‍යම පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය සිරිමල්ලයන ඔගස්ටාවත්ත මහනුවර.	0718457013
3	**දකුණ**	දකුණු පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය දකුණු පළාත බෝපේ, ගාල්ල.	0702587434
4	**වයඹ**	වයඹ පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය උසාවි පාර, වාරියපොළ.	0718457013
5	**උතුරු මැද**	උතුරු මැද පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය මහවැලි පැන්න, ඔලූකරඳ, කැකිරාව.	0718289004 025-9264180
6	**ඌව**	ඌව පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය යාලබෝවවත්ත, වැල්ලවාය.	0770460352 057-2052393
7	**සබරගමුව**	සබරගමුව පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය ගංගොඩවත්ත, කෑගල්ල.	0702576555
8	**නැඟෙනහිර**	නැගෙනහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය රවුන් පාර, සද්ධාපුර, ත්‍රිකුණාමලය.	0712518825
9	**උතුර**	උතුරු පළාත් අධ්‍යක්ෂ කාර්යාලය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය ඉරට්ටපෙරියකුලම්, වව්නියාව.	0710889436

පුහුණු මධ්‍යස්ථාන

අනු අංක	පළාත	මධ්‍යස්ථානය	ලිපිනය	දුර.අංකය
1	**කටුනායක**	බස්නාහිර	ධම්මාලෝක මාවත, වලාන, කටුනායක	0112-260 020
2	**අත්තනගල්ල**		වතුපිටිවල, අත්තනගල්ල, නිට්ටඹුව.	033-228 2232
3	**දිවුලපිටිය**		වල්පිට, දිවුලපිටිය.	033-227 2875
4	**බුලත්සිංහල**		ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථානය, බුලත්සිංහල.	034-228 2322
5	**යක්කල**		වැරැල්ලවත්ත, යක්කල.	033-223 3534
6	**ගම්පොළ**	මධ්‍යම	නාවලපිටිය පාර, කුඩමාකේ, ගම්පල	081-207 8177
7	**නාඋල**		අරංගල, නාඋල	066-224 6204
8	**නුවරඑළිය**		මීපිලිමාන, අඹේවල, නුවරඑළිය	052-353 6332
9	**වලපනේ**		හරස්බැද්ද, වලපනේ	052-205 0010
10	**සෙංකඩගල**		සිරිමල් උයන, ඔගස්ටාවත්ත, මහනුවර	081-238 9134
11	**යටිනුවර**		යටිනුවර, පිලපිටිය, මුරුතලාව	081-241 0026
12	**ගාල්ල**	දකුණ	වැකුණුගොඩ, බෝපේ, ගාල්ල	091-223 3182
13	**නෙළුව**		පියසේන ගමගේ ගොඩනැගිලි සංකීර්ණය, අඹලේගෙදර, නෙළුව	091-309 8911
14	**අකුරැස්ස**		මාරඹ, අකුරැස්ස	041-313 1216
15	**වීරකැටිය**		නයිගල, හකුරුඇළ, වීරකැටිය	047-225 7143
16	**සූරියවැව**		මධ්‍යවිද්‍යාල පාර, සූරියවැව	047-228 8169
17	**අක්මීමන**		කුරුඳුවත්ත, අක්මීමන	091-312 1736
18	**දික්වැල්ල**		උෆරුගමුව, දික්වැල්ල	041-225 5055
19	**ලුණුගම්වෙහෙර**		ලුණුගම්වෙහෙර, තලාව	047-223 9292
20	**වීරවිල**		ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථානය, වීරවිල	047-312 8444
21	**කුලියාපිටිය**	වයඹ	දෙගම්මැද්ද, වැවගම, කුලියාපිටිය	037-228 3680
22	වාරියපොළ		උසාවි පාර, වාරියපොළ	037-226 8375
23	මාවතගම		ඩොන්වෝර් වත්ත, මාවතගම	037-229 8668
24	පඬුවස්නුවර		නුගවෙල හන්දිය, පඬුවස්නුවර	037-229 1803
25	දොඩම්ගස්ලන්ද		අලකොලමඩ, මදුරාගොඩ, දොඩම්ගස්ලන්ද	037-225 2655
26	නාත්තණ්ඩිය		සාගරගම, නාත්තණ්ඩිය	032-205 0815
27	වෙන්නප්පුව		රණවිරු කමලසිරි මාවත, බෝලාන, වයික්කාල්.	031-227 7199
28	අලව්ව		වලිගමුව, අලව්ව	037-206 7885

29	කැකිරාව	උතුරුමැද	මහවැලි පැත්ත, ඔලුකරඳ, කැකිරාව	025-226 3297
30	කලාවැව		ගල්නෑව, බුල්නෑව, කලාවැව	025 -226 9946
31	අනුරාධපුර		මාපාලඩිකුලම්, අනුරාධපුර	025-385 2809
32	මැදිරිගිරිය		කවුඩුළුගම, මැදිරිගිරිය	027-205 0477
33	ගලෙන්බිඳුණුවැව		යක්කල, ගලෙන්බිඳුණුවැව	025-225 8355
34	බණ්ඩාරවෙල	ඌව	බිඳුණුවැව, බණ්ඩාරවෙල	057-222 2214
35	මහියංගණය		මාපාකඩ, මහියංගණය	055-225 7118
36	තණමල්විල		බෝදාගම, මහියංගණය	047-322 0529
37	මොණරාගල		වැලියාය, මොණරාගල	055-205 5741
38	වැල්ලවාය		යාලබෝවත්ත, වැල්ලවාය	055-2274157
39	සියඹලාණ්ඩුව		19 වෙනි සැතපුම, පොතුවිල් පාර, සියඹලාණ්ඩුව	070-353 8292
40	නිවිතිගල	සබරගමුව	අම්බලන්දෙණිය, වටපොතපාර, නිවිතිගල	045-227 9970
41	ගලිගමුව		අසිදෙනිය, ගලිගමුව නගරය, ගලිගමුව	035-228 2993
42	ඇඹිලිපිටිය		'ගම් උදා' ඉඩම, යෝධගම, ඇඹිලිපිටිය	047-226 2399
43	කෑගල්ල		ගංගොඩවත්ත, කෑගල්ල	035- 222 3260
44	බලංගොඩ		බටුගම්මන, බලංගොඩ	045- 312 9898
45	දෙහිඕවිට		කනන්ගම, දෙහිඕවිට	036-226 7671
46	අම්පාර	නැගෙනහිර	අධ්‍යාපන පරිපාලන කාර්යාලය, උහන පාර, අම්පාර	063-222 4810
47	සේරුවාවිල		සේරුවාවිල, අලිඔළුව, සේරුනුවර	026-454 9439
48	ගෝමරන්කඩවල		විල්පානකුලම, ගෝමරන්කඩවල	026-454 9428
49	කුච්චවේලි		සලපේආරු, කුච්චවේලි	026-222 8709
50	ත්‍රිකුණාමලය		රවුන් පාර, සද්ධාපුර, ත්‍රිකුණාමලය	026-454 9432
51	දෙහිඅත්තකණ්ඩිය		ලිහිණියාගම, දමනවෙල, දෙහිඅත්තකණ්ඩිය	027-205 6723
52	වාලච්චේන		18 කණුව, ගාන්ධිනගර් පාර, කල්කුඩා, වාලච්චේන	065-312 1085
53	මුලතිව්	උතුර	වට්ටුවාක්කල්, මුලතිව්	021-229 0428
54	මන්නාරම		තලෙමන්නාරම පාර, මන්නාරම	023-225 1917
55	වව්නියාව		ඉරට්ටපෙරියකුලම්, වව්නියාව	024-205 4558

3.2 පුහුණු මධ්‍යස්ථාන පිහිටීම් සිතියම



3.3 පුහුණු මධ්‍යස්ථානයක පවත්නා පහසුකම්

භූමියේ පවත්නා ඉඩ පහසුකම් අනුව එක් අදියරකට පුහුණුලාභීන් 150 ත් 250 ත් අතර ප්‍රමාණයකට පුහුණුව ලබාදිය හැකි වන පරිදි පුහුණු මධ්‍යස්ථාන ගොඩනගා ඇති අතර බොහෝ පුහුණු මධ්‍යස්ථානයන්හි පහත සඳහන් පහසුකම් පවතී.

- කාර්යාලයක්
- පුහුණුලාභීන් 40 - 50 ට පුහුණුව ලැබිය හැකි පන්ති කාමර 4 හෝ 5
- දේශන ශාලාවක්
- පරිගණක 25 කින් සමන්විත පරිගණක විද්‍යාගාරයක්
- භෝජනාගාරයක්
- මුළුතැන්ගෙයක්
- දුර බැහැර පුහුණුලාභීන් සඳහා නේවාසික පහසුකම්
- ඇඳුම්මාරු කිරීමේ කාමර
- කාන්තා හා පිරිමි වැසිකිලි පද්ධතියක්
- ක්‍රීඩා පිටියක්
- අන්තර්ජාල හා දුරකථන පහසුකම්

පුහුණු මධ්‍යස්ථානයකට පහත සඳහන් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර ඇත.

- මධ්‍යස්ථානාධිපති - 01
- සහාය මධ්‍යස්ථානාධිපති - 01
- සංවර්ධන සහකාර (වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක) - 02
- සංවර්ධන සහකාර (පෞරුෂ සංවර්ධන උපදේශක) - 01
- සංවර්ධන සහකාර (සෞන්දර්ය උපදේශක) - 01
- උපදේශක (තොරතුරු තාක්ෂණ) - 01
- උපදේශක (ඉංග්‍රීසි) - 01
- උපදේශක (දෙමළ) - 01
- උපදේශක (සරඹ) - 03
- කළමනාකරණ සහකාර - 01
- සරඹ / විනය උපදේශක - 02
- ගබඩාකරු - 01

4. ප්‍රගති සමාලෝචනය - 2021

2021 වර්ෂයේ දී තරුණ සංවර්ධනය හා වෘත්තීය පුහුණුව අරමුණු කොට ගෙන ක්‍රියාත්මක කරන ලද පුහුණු, සංවර්ධන හා ප්‍රජා වැඩසටහන්හි ප්‍රගති සමාලෝචනය පහත පරිදි වේ.

4.1 ජීවන කුසලතා පුහුණුව (යෞවන යෞවනියන් පුහුණු කිරීම)

ක්‍රියාකාරකම	ඉලක්කගත		ප්‍රගතිය				ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස	ඉදිරි ඉලක්කය
	වැඩසටහන්	සහභාගිත්වය	වැඩසටහන්	සහභාගිත්වය				
				ගැහැණු	පිරිමි	එකතුව		
ජීවන කුසලතා පුහුණුව	**110**	**10,000**	**110**	**4111**	**3935**	**8046**	**වැඩසටහන් 100% සහභාගිත්වය 80%**	2022 වර්ෂයේ පාඨමාලා 3 ක් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත ශ්‍රී ලංකා බෞද්ධ විශ්වවිද්‍යාලය මඟින් ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණ විෂය සඳහා සහතික පත්‍රයක් ලබාදීමට සැලසුම් කර ඇත.

සටහන : සය මාසික පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක වන ජීවන කුසලතා පාඨමාලාවට ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ විෂය ධාරාව ද අන්තර්ගත වන අතර ජීවන කුසලතා පාඨමාලාව අවසානයේ පුහුණුලාභීන් වෘත්තීය පුහුණුව වෙත ද යොමු කරනු ලැබේ.

ජීවන කුසලතා පුහුණුව (යෞවන යෞවනියන් පුහුණු කිරීම)



4.1.1 තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව

පාඨමාලාව	සමත් සංඛ්‍යාව	සමත් ප්‍රතිශතය %
Level 01		
තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව	1339	95
ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව	1314	96
Level 02		
තොරතුරු තාක්ෂණ උසස් සහතික පත්‍ර පාඨමාලාව	1213	92
ඉංග්‍රීසි උසස් සහතික පත්‍ර පාඨමාලාව	1191	90

තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂා පාඨමාලාව හැදෑරූ පුහුණුලාභීන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියලත් උසස් සහතික පත්‍රයක් පිරිනැමීමට හැකියාව ලැබීම.

මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ ඉගැන්වීම් කටයුතු සඳහා අවශ්‍ය නිදහස් දත්ත (Free Data) සඳහා Data SIM පුහුණුලාභීන් 1787 ක් සඳහා නොමිලේ ලබාදුන් අතර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉගැන්වීම් කටයුතු SIBA – NYC Black Board නමැති Learning Management System හරහා සිදුකරන ලදී.

2021 වසරේ මූලික පුහුණු පාඨමාලාවේ පළමුවෙනි කණ්ඩායම සඳහා යෞවන යෞවනියන් 2329 ක් ලියාපදිංචි වී සිටි නමුත් 2021.06.05 දින වන විට පාඨමාලා සමඟ සම්බන්ධ වී සිටි පුහුණුලාභීන් සංඛ්‍යාව 1787 කි. පැවැති කොවිඩ් 19 තත්ත්වය යටතේ සෞඛ්‍ය මාර්ගෝපදේශනයට අනුව පුහුණු මධ්‍යස්ථානවල සාමාන්‍ය පුහුණු කටයුතු ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති වූ බැවින් මාර්ගගත දුරස්ථ ක්‍රමවේදයන් මගින් මූලික පුහුණු කටයුතු පවත්වාගෙන යෑමට කටයුතු කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය (SIBA) සමඟ ඒකාබද්ධව මෙහෙයවනු ලබන ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ විෂයයන් හා මූලික පාඨමාලාවේ අන්තර්ගත හර විෂයයන් වූ පෞරුෂ සංවර්ධනය හා වෘත්තිය මාර්ගෝපදේශනය විෂයයන් ද මාර්ගගත ක්‍රමවේදයන්ට අනුව පවත්වනු ලැබීය. ඒ අනුව පවතින වසංගත තත්ත්වය අභියෝගාත්මකව භාර ගනිමින් පුහුණු කටයුතු නතර කිරීමකින් තොරව ක්‍රියාත්මක කිරීමෙන් යොවුන් සේනාංකය හා එක්ව සිටින තරුණ ප්‍රජාව වෙත ඵලදායී පුහුණු අවස්ථාවන් සංවිධානය කිරීමට හැකියාව ලැබුණි.

මෙම මාර්ගගත පුහුණු සැසි සඳහා පුහුණුලාභීන් ද ඉතා උනන්දුවෙන් සහභාගි වන ලදී. එමෙන්ම පුහුණුලාභීන් සඳහා පුහුණු සැසිවලට සහභාගි වීමට අවශ්‍ය අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සඳහා සිම්කාඩ් පතක් ද ලබාදීමෙන් පුහුණු පහසුකම් සම්පාදනය කිරීමට ද හැකියාව ලැබුණි. ඒ අනුව එම පුහුණුලාභීන් සඳහා නොමිලේ Data සිම්පත් ලබාදීමට කටයුතු කරන ලදී. මධ්‍යස්ථානවලින් ලැබුණු තොරතුරුවලට අනුව රැකියා සඳහා යොමුවීම සහ වෙනත් විවිධ පෞද්ගලික හේතූන් මත ඇතැම් පුහුණුලාභීන් පාඨමාලා හැරගොස් තිබුණි.

දෙවන අදියරේ (Level 02) පාඨමාලා ඉගැන්වීම් අන්තර්ගතය ප්‍රයෝගික ක්‍රියාකාරකම් රැසකින් සමන්විත වේ. එබැවින් සංචරණ සීමා කාලය තුළදී එම ක්‍රියාකාරකම් පරිගණක විද්‍යාගාර තුළ සිදුකිරීමට හැකියාවක් නොලැබුණි. එසේම පුහුණුලාභීන් පාඨමාලා හැදෑරීම සඳහා මෙන්ම විභාග කටයුතු සඳහා තම පෞද්ගලික දුරකථන, පරිගණක සහ විවිධ අන්තර්ජාල පිවිසීම් ක්‍රමවේද භාවිතා කරන ලදී. එහිදී පුහුණුලාභීන් මුහුණදුන් විවිධ තාක්ෂණික ගැටලු විභාග සඳහා පෙනී සිටි සංඛ්‍යාව අඩු අගයක් ගැනීමට හේතු විය.

4.1.2 වෘත්තීය පුහුණුවට යොමු කිරීම්

ඉලක්කගත (ඒකක)	වෘත්තීය පුහුණුවට යොමු කිරීම්	ප්‍රගතිය %
3300 පුහුණුලාභීන්	716	22

4.1.3 හෝටල් පුහුණු පාඨමාලාව

ඉලක්කගත (ඒකක)	ලියාපදිංචි පුහුණුලාභීන්	ප්‍රගතිය %	රැකියාගත කිරීම්	
			රැකියාගත කළ සංඛ්‍යාව	%
400 පුහුණුලාභීන්	86	22	37	9.3



4.2 විශේෂ ජීවන කුසලතා හා නායකත්ව සංවර්ධන වැඩසටහන්

ක්‍රියාකාරකම	ඉලක්කගත		ප්‍රගතිය		ප්‍රතිශතයක් ලෙස %
	වැඩසටහන්	සහභාගිත්වය	වැඩසටහන්	සහභාගිත්වය	
පාසල් ශිෂ්‍ය නායකයින් පුහුණු කිරීම	110	2500	9	548	**වැඩසටහන් - 8%** **සහභාගිත්වය - 22%** (පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් දීර්ඝ කාලයක් පාසල් තාවකාලිකව වසා දමා තිබුණු බැවින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.)
බහුකාර්ය සංවර්ධන කාර්යය සාධක බලකා වැඩසටහන	2	39612	2 **(අදියර 11)**	33084	**වැඩසටහන් - 100%** **සහභාගිත්වය - 84%**

4.3 තරුණ සංවර්ධන වැඩසටහන්

ක්‍රියාකාරකම	ඉලක්කගත		ප්‍රගතිය		ප්‍රතිශතයක් ලෙස %
	වැඩසටහන්	සහභාගිත්වය	වැඩසටහන්	සහභාගිත්වය	
මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන	110	10,000	39	3520	**වැඩසටහන් - 35%** **සහභාගිත්වය - 35%**
ලිංගික සම්ප්‍රේෂණ රෝග (STD) වැළැක්වීමේ වැඩසටහන	110	10,000	39	1222	**වැඩසටහන් - 35%** **සහභාගිත්වය - 12%**
බෝ නොවන රෝග (NCD) වැළැක්වීමේ වැඩසටහන	110	10,000	36	1143	**වැඩසටහන් - 33%** **සහභාගිත්වය - 11%**
ප්‍රජා සංවර්ධන වැඩසටහන	110	10,000	35	1040	**වැඩසටහන් - 32%** **සහභාගිත්වය - 10%**
රචනා තරඟාවලිය (මධ්‍යස්ථාන මට්ටම)	110	10,000	55	3762	**වැඩසටහන් - 50%** **සහභාගිත්වය - 38%**

විවාද තරඟාවලිය (මධ්‍යස්ථාන මට්ටම)	110	10,000	55	3625	**වැඩසටහන් - 50%** **සහභාගිත්වය - 36%**
දැනුම මිනුම තරඟාවලිය (මධ්‍යස්ථාන මට්ටම)	110	10,000	55	3701	**වැඩසටහන් - 50%** **සහභාගිත්වය - 37%**
ආපදා කළමනාකරණ වැඩසටහන (දින තුනක)	110	10,000	18	1514	**වැඩසටහන් - 16%** **සහභාගිත්වය - 15%**
ක්‍රීඩා උලෙළ (මධ්‍යස්ථාන මට්ටම)	110	10,000	51	6700	**වැඩසටහන් - 46%** **සහභාගිත්වය - 67%**
'Life Ladder තරුණ දිවියට හරිමග' වැඩසටහන	03	70	01	41	**වැඩසටහන් - 33%** **සහභාගිත්වය - 59%**
කලා උලෙළ (ජාතික මට්ටම - පෞරුෂාභිමානී)	01	1150	01	1115	**වැඩසටහන් - 100%** **සහභාගිත්වය - 97%**
විසිරයෑමේ උලෙළ (ජාතික/මධ්‍යස්ථාන මට්ටම) **(සටහන් - 01)**	01	3000	54	3966	**වැඩසටහන් - 100%** **සහභාගිත්වය - 132%**
මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී පුනරුත්ථාපනය වූ පුහුණුලාභීන් වෘත්තීය පුහුණු පාඨමාලා වෙත යොමු කිරීම	01	18	01	05	**වැඩසටහන් - 100%** **සහභාගිත්වය - 28%**
වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සඳහා මෘදු කුසලතා පුහුණු වැඩසටහන	01	7000	01	10,825	**වැඩසටහන් - 100%** **සහභාගිත්වය - 155%**

සටහන් 01 : 2021 වර්ෂය තුළ ජාතික මට්ටමේ විසිරයෑමේ උත්සවයක් පැවැත්වීමට සැලසුම් කළ නමුත් මෙම වර්ෂය තුළ පැවැති කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විසිරයෑමේ උත්සව මධ්‍යස්ථාන මට්ටමින් පැවැත්වීමට කටයුතු කරන ලදී.

මෙම පාඨමාලා කාලසීමාව තුළ පැවති කෝවිඩ් 19 තත්ත්වය හේතුවෙන් ඇතැම් මධ්‍යස්ථාන තාවකාලිකව වසා දැමීමට සිදුවීම, මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයන කටයුතු සිදුකිරීම, පුද්ගල දුරස්ථබව පවත්වාගත යුතු බැවින් පුහුණුලාභීන් / ලාභිනියන් රැස්කිරීමට නොහැකි වීම ආදී නොයෙකුත් හේතූන් මත සංවර්ධන වැඩසටහන් මඟින් භෞතිකව අපේක්ෂා කළ ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි විය.

4.4 ධීර අභ්‍යාස පුහුණුව (Adventure Base Training)

වැඩසටහන	ජයග්‍රහණ සහ ළඟා කරගත් ඉලක්ක	ඉදිරි ඉලක්ක	අභියෝග
ධීර අභ්‍යාස පුහුණුව	එක් මධ්‍යස්ථානයකින් ඉහළ දක්ෂතා පෙන්වූ පුහුණුලාභීන් 10 දෙනෙකු බැගින් ධීර අභ්‍යාස පුහුණුව සඳහා තෝරා ගත් අතර 2021.12.31 වන විට මධ්‍යස්ථාන මට්ටමින් පුහුණුලාභීන් 510 දෙනෙකු ධීර අභ්‍යාස පුහුණුව සඳහා සහභාගි වී ඇත. බාහිර පුහුණුලාභීන් 55 කට පුහුණුව ලබා දී ඇත.	මධ්‍යස්ථානවල සියලුම පුහුණුලාභීන්ට ධීර අභ්‍යාස පුහුණුව ලබාදීමට කටයුතු කිරීම. බාහිර පාර්ශ්ව සඳහා ද ධීර අභ්‍යාස පුහුණුව ලබාදීම.	පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය අනුව පනවා ඇති නව සෞඛ්‍ය නීතිරීති හේතුවෙන් පුහුණු කටයුතු සීමා කිරීමට සිදුවීම.

4.5 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

වැඩසටහන	ජයග්‍රහණ සහ ළඟාකරගත් ඉලක්ක	ඉදිරි ඉලක්ක	අභියෝග
පුහුණුකරුවන් පුහුණු කිරීම (TOT)	2021 වර්ෂයේ දී වාර්ෂික පුහුණු සැලැස්මට අනුව පුහුණුකරුවන් පුහුණු කිරීම මිනිස් දින 2500 ක් ලෙස සැලසුම් කර තිබුණි. එමෙන්ම පැවැති වසංගත තත්ත්වය හමුවේ මාර්ගගත ක්‍රමවේදයට අනුව පුහුණු වැඩසටහන පැවැත් වූ අතර එහි දී මිනිස් දින 6198 ක් සම්පූර්ණ කිරීමට හැකි විය. සහභාගිත්වය 4885 ක් වේ.	2022 වර්ෂයේ වාර්ෂික පුහුණු සැලැස්මට අනුව පුහුණුකරුවන් පුහුණු කිරීම මිනිස් දින 2500 ක් ලෙස සැලසුම් කර ඇත.	පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පනවා ඇති නව සෞඛ්‍ය නීතිරීතිවලට අනුකූලව පුහුණු කටයුතු සීමා කිරීමට සිදුවීම.
පාලන කාර්ය මණ්ඩල පුහුණුව	ආයතනික නිලධාරීන් 35 දෙනෙනකුට පුහුණුව ලබාදීමට කටයුතු කර ඇත	සමස්ත කාර්යය මණ්ඩලයේ කාර්යය සාධනයන් සහ ඵලදායිත්වය ඉහළ නැංවීම උදෙසා කාර්යය මණ්ඩල පුහුණු සැසි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.	

4.6 ප්‍රාග්ධන ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය

සමස්ත භෞතික ප්‍රගතිය

විස්තරය	භෞතික ප්‍රගතිය (%)
පුනරුත්ථාපන වැඩ විෂයයන්	100
ප්‍රාග්ධන ව්‍යාපෘති(අත්පත් කර ගැනීම්)	90
ධාරිතා සංවර්ධනය (පුහුණු කරුවන් පුහුණු කිරීම (TOT) / කාර්යය මණ්ඩල පුහුණුව)	90
ප්‍රසම්පාදන	95
එකතුව	**94**

ප්‍රාග්ධන ව්‍යාපෘති (පුනරුත්ථාපන වැඩ විෂයයන්)

වැය අංකය	පළාත	මධ්‍යස්ථානය	වැඩ විෂය	භෞතික ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය විස්තරාත්මකව
2001					
1	බස්නාහිර පළාත	කටුනායක	රෙන්ජර්වරුන්ගේ ඇදුම් මාරු කිරීමේ කාමර දෙකෙහි ඉහළ කොටසට කොටු දැල් ගසා ආවරණය කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
2	වයඹ පළාත	වාරියපොළ	ඉදිරිපස වැට වෙනුවට දැල් ආවරණයක් සැකසීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
3			NVQ කාමරයේ දැල් ආවරණය කිරීම සහ දොරක් දැමීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
4			නව වැසිකිළියක් සහ වොෂ් බේසින් සවි කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
5			මුළුතැන්ගෙයි පිටුපස හා දකුණුපස ආරක්ෂිත වැට අලුතින් ඉදිකිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
6		පඬුවස්නුවර	මධ්‍යස්ථානයේ පිටුපස හා දකුණුපස ආරක්ෂිත වැට අලුතින් ඉදිකිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
7		වෙන්නප්පුව	මධ්‍යස්ථානය වටා ආරක්ෂිත වැඩ අලුත්වැඩියාව	100%	බිල්පත් නිරවුල් කර ඇත
8		කුලියාපිටිය	පන්තිකාමර ප්‍රදේශයට සිමෙන්ති දමා බැම්මක් ඉදිකිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
9		මාවතගම	යෞවන යෞවනියන්ගේ නේවාසිකාගාරයේ දොර ජනේල් අලුත්වැඩියා කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත

10	උතුරු මැද පළාත	කැකිරාව	විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
11		ගලෙන්බිඳුණුවැව	මුර කුටියක් ඉදිකිරීම	100%	බිල්පත් මූල්‍ය අංශය වෙත භාරදී ඇත.
12	දකුණු පළාත	වීරකැටිය	කාන්තා නේවාසිකාගාරයේ ජනේල සඳහා ග්‍රිල් ගැසීම සහ දොර අගුලු සැකසීම හා සිවිලිම සැකසීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
13		අක්මීමන	වැසිකිලි පද්ධතිය ඉදිකිරීම/ප්‍රධාන ගොඩනැගිල්ලේ වැහි පීලි හා පී.වී.සී හට අලුත්වැඩියා කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
14	මධ්‍යම පළාත	නාඋල බැහැරගත	ප්‍රධාන ගේට්ටුවේ සිට නිලධාරී නිවස්නය දක්වා මාර්ගය ඉන්ටර්ලොක් ගල් ඇතිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
15			නේවාසිකාගාර ගොඩනැගිල්ලෙහි බිම් මහල (Balance Work)	100%	ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී
16			ආරක්ෂක තාප්පය ඉදිකිරීම(ඇල මාර්ගය අසළ) දිග උඩි 270	100%	බිල්පත් නිරවුල් කර ඇත
17		දඹුල්ල හෝටල් පුහුණු පාසල	විදුලිජනක යන්ත්‍රය තැබීමට ආවරණයක් සැකසීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
18	නැගෙනහිර පළාත	කුච්චවේලි	ප්‍රධාන ගේට්ටුව ඉදි කිරීම	100%	
19		දෙහිඅත්තකණ්ඩිය	කාර්යාලයේ හා පරිගණක විද්‍යාගාරයේ සිවිලිම සකස් කිරීම	100%	බිල්පත් ලැබී ඇත. අඩුපාඩු සහිතයි
20	උඟව පළාත	තණමල්විල	මුළුතැන්ගෙයි සින්ක් පද්ධතිය සැකසීම සහ අඩි 02 පළල කොන්ක්‍රීට් ප්ලේට් දැමීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
21		මොණරාගල	ආරක්ෂිත ගේට්ටුව ඉදි කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
22		මහියංගණය	ජල කරාම 05 කින් යුත් ස්ථානයක් සකස් කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
23	සබරගමු පළාත	කෑගල්ල	මධ්‍යස්ථානය වටා ආරක්ෂිත වැට ප්‍රතිසංස්කරණය කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
24			නළ ළිඳ ඉදිකිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
25		ඇඹිලිපිටිය	වැසිකිලි පද්ධතිය ඉදි කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
26	උතුරු පළාත	මන්නාරම	වහලය අලුත්වැඩියා කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත

27		මූලස්ථානය	කොඩි සහිත පීඨිකාවක් සකස් කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
28			සභාපතිතුමාගේ නිළ කාමරයට යාබදව පිහිටා ඇති නාන කාමරය අලුත්වැඩියා කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
29			ගබඩා ගොඩනැලගිල්ලේ ඇළුමිනියම් දොරවල් සවි කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
30			පසුපස තාප්පය අඩි 07 කින් ඔසවා ඉදි කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
31	දකුණු පළාත	අක්මීමන	මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධති දෙකක් ඉදිකිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
32	සබරගමු පළාත	කෑගල්ල	නිලධාරී විවේකාගාරයේ සිවිලිම සකස් කිරීම	100%	බිල්පත් ලැබී ඇත. අඩුපාඩු සහිතයි
33			පළාත් කාර්යාලය පිළිසකර කර අලුත්වැඩියා කිරීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
34	මධ්‍යම පළාත	යටිනුවර	මධ්‍යම පළාත් කාර්යාලය මධ්‍යස්ථාන භෝජනාගාරය සහ ප්‍රධාන ගබඩාව වෙත පිවිසෙන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සකස් කර ගැනීම	100%	බිල්පත් නිරවුල් කර ඇත
35	නැගෙනහිර පළාත	අම්පාර	මධ්‍යස්ථානයේ විදුලි ආලෝක පද්ධතිය සවි කිරීම	100%	බිල්පත් ලැබී ඇත. අඩුපාඩු සහිතයි
එකතුව				**100%**	

ප්‍රාග්ධන ව්‍යාපෘති (අත්පත් කර ගැනීම්)

වැය අංකය 2104	ව්‍යාපෘතිය / වැඩසටහන	භෞතික ප්‍රගතිය%	භෞතික ප්‍රගතිය විස්තරාත්මකව
1	අලව්ව ස්ථාන මධ්‍යස්ථානය ඉදිකිරීම	100%	ගොඩනැගිලි පහකින් සමන්විතය. සියල්ල ඉදිකර ඇත.
2	වාලච්චේන මධ්‍යස්ථානය ඉදිකිරීම	100%	ගොඩනැගිලි පහකින් සමන්විතය. සියල්ල ඉදිකර ඇත.
3	ගෝමරන්කඩවල මධ්‍යස්ථානය ඉදිකිරීම	100%	ගොඩනැගිලි පහකින් සමන්විතය. සියල්ල ඉදිකර ඇත.
4	ත්‍රිකුණාමලය මධ්‍යස්ථානය ඉදිකිරීම	100%	ගොඩනැගිලි පහකින් සමන්විතය. සියල්ල ඉදිකර ඇත.
5	සූරියවැව මධ්‍යස්ථානය ඉදිකිරීම	100%	ගබඩා ගොඩනැගිල්ලෙහි අත්තිවාරම දමා බිම කොන්ක්‍රීට් කර ඇත. මුළුතැන්ගෙහි කණු ගසා වහලය දමා කොන්ක්‍රීට් කර ඇත. ශ්‍රවනාගාරයේ අත්තිවාරම් දමා බිම කොන්ක්‍රීට් කර ඇත. පන්ති කාමර ගොඩනැගිල්ලෙහි කණු ගසා කොන්ක්‍රීට් තට්ටුව දමා වහලයට ෂීට් ගසා ඇත. නේවාසිකාගාර ගොඩනැගිල්ලෙහි අත්තිවාරම දමා බිම කොන්ක්‍රීට් කර ඇත.
6	හලාවත මධ්‍යස්ථානය ඉදිකිරීම	40%	පන්තිකාමර, පරිගණක විද්‍යාගාර ගොඩනැගිල්ල හා පරිපාලන ගොඩනැගිල්ලෙහි කණු ගසා බිත්ති බැඳ ඇත. මුළුතැන්ගෙය හා ගබඩා ගොඩනැගිල්ලෙහි බිම කොන්ක්‍රීට් කර කණු ගසා ඇත.
7	දඹුල්ල මධ්‍යස්ථානය ඉදිකිරීම	70%	ගොඩනැගිලි පහකින් සමන්විතය. එහි පන්තිකාමර, පරිගණක විද්‍යාගාර ගොඩනැගිල්ල හා පරිපාලන ගොඩනැගිල්ලෙහි කණු ගසා බිත්ති බැඳ වහලය ගසා ඇත. කාන්තා හා පිරිමි ඇඳුම් මාරු කිරීමේ ගොඩනැගිල්ලේ කණු ගසා බිත්ති බැඳ ඇත. කොන්ක්‍රීට් තට්ටුව දැමීමට නියමිතව ඇත. ශ්‍රවනාගාරයේ කණු පමණක් ගසා ඇත. ගබඩා ගොඩනැගිල්ලේ හා මුළුතැන්ගෙහි කනු ගසා බිත්ති බැඳ වහලය ගසා ඇත,විදුලි පරිපථ සකසා දොර ජනෙල් සවිකර ඇත.
8	වීරවිල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයට නව ජල සම්බන්ධතාවය ලබා ගැනීම	100%	මෙම වැඩ විෂය අවසන් කර ඇත
9	ලුණුගම්වෙහෙර ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයට නව ජල සම්බන්ධතාවය ලබා ගැනීම	100%	අවසන් අදියරේ පවතී
10	ලුණුගම්වෙහෙර නව ජල සැපයුම් සබඳතාව ලබා ගැනීමේදී ප්‍රධාන මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් ගෙවීම		
11	සූරියවැව (Balance Work & Toilet Block)	100%	අවසන් අදියරේ පවතී
12	මූලස්ථානයේ ඉදිරිපස තාප්පය ඉදිකිරීම	100%	ඉදි කිරීම් නිම කර ඇත.

13	ලේඛනාගාරය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම	100%	ඉදි කිරීම් නිම කර ඇත.
14	මොණරාගල - අදියර 04	100%	ඉදි කිරීම් නිම කර ඇත.
15	නාඋල අදියර 02 - නේවාසිකාගාර ගොඩනැගිල්ල	60%	වහළය දක්වා බිත්ති බැඳ ඇත.
16	කටුනායක වැසිකිලි පද්ධති - අමතර වැඩ E2	100%	ඉදි කිරීම් නිම කර ඇත.
17	බණ්ඩාරවෙල වැසිකිලි පද්ධති - අමතර වැඩ E1	100%	ඉදි කිරීම් නිම කර ඇත.
18	මානව සම්පත් අංශය සහ ආරක්ෂක මුරකුටිය වැඩිදියුණු කිරීම සඳහා	100%	ඉදි කිරීම් නිම කර ඇත.
19	කතරගම (Balance Work)	100%	ඉදි කිරීම් නිම කර ඇත.
20	නිවිතිගල (Balance Work)	100%	ඉදි කිරීම් නිම කර ඇත.
21	දික්වැල්ල (Balance Work)	100%	ඉදි කිරීම් නිම කර ඇත.
22	උපදේශන සේවා ගාස්තු ගෙවීම සඳහා	100%	ඉදි කිරීම් නිම කර ඇත.
එකතුව		**90%**	

ප්‍රසම්පාදන

	වැඩසටහන් ප්‍රමාණය	**ඇස්තමේන්තුගත පිරිවැය**	**ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**	
			භෞතික ප්‍රගතිය	**මූල්‍ය ප්‍රගතිය**
ප්‍රාග්ධන වියදම්				
01	ලී බඩු සහ උපකරණ	24.39	75%	10%
02	දේපල පිරියත උපකරණ	57.01	75%	38%
03	ගොඩනැගිලි හා ඉදිකිරීම්	205.07	92%	74%
04	දේපල පිරියත උපකරණ අළුත්වැඩියා	1.00	75%	0%
05	ගොඩනැගිලි හා ඉදිකිරීම් අළුත්වැඩියා	30.80	98%	59%
06	ප්‍රවාහන අළුත්වැඩියා	1.00	90%	62%
07	මෘදුකාංග සංවර්ධන	3.00	50%	13%
එකතුව		**322.27**	**95%**	**61%**

ධාරිතා සංවර්ධනය - පුහුණු අංශය

වැය අංකය	ව්‍යාපෘතිය / වැඩසටහන	2021 වර්ෂය සඳහා ඉලක්කය	මුළු ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය විස්තරාත්මකව
194-02-07-01-2201	පුහුණු කරුවන් පුහුණු කිරීම (TOT)	වර්ෂය සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීම මිනිස් දින 2500 ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය	100	2021 වර්ෂයේ දී වාර්ෂික පුහුණු සැලැස්මට අනුව පුහුණු කරුවන් පුහුණු කිරීම මිනිස් දින 2500 ක් ලෙස සැලසුම් කර තිබුණි. එමෙන්ම,පැවති වසංගත තත්වය හමුවේ මාර්ගගත ක්‍රමයට අනුව පුහුණු වැඩසටහන පැවැත් වූ අතර, එහිදී මිනිස් දින 6402 ක් සිදු කිරීමට හැකි විය.
	කාර්යය මණ්ඩල පුහුණුව (Staff Training)		100	යොවුන් සේනාංක මූලස්ථාන කාර්යය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීම අරමුණු කර ගනිමින් 2021 වර්ෂයේ දෙසැම්බර් මස පවත්වන ලද කාර්යය මණ්ඩල කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිලිබඳ පුහුණු වැඩසටහන වෙනුවෙන් ගෙවීම් සිදු කරන ලදී.
	කාර්යය මණ්ඩල ශිෂ්‍යත්ව (Staff schoolership)	ශිෂ්‍යත්ව 10 ක් ලබා දීමට අපේක්ෂිතය	70	2021 වර්ෂයට අදාලව යාවත්කාලීන කරන ලද පුහුණු ප්‍රතිපත්තිය යටතේ කාර්යය මණ්ඩල ශිෂ්‍යත්ව 10 ක් පමණ ලබා දීමට අපේක්ෂා කර තිබුණි. ඒ අනුව කාර්යය මණ්ඩල සේවකයන් 07 දෙනෙකු සඳහා රු.312000.00 ක මුදලක් දක්වා දෙසැම්බර් මස වන විට ශිෂ්‍යත්ව ලබා දීමට හැකි වී ඇත.
එකතුව			**90**	

4.7 පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය

2021 වර්ෂයේදී පුනරාවර්තන වියදම්වල හා ප්‍රාග්ධන වියදම්වල සමස්ත මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

ප්‍රතිපාදන වර්ග	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සේනාංකයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ජාතික යොවුන් සේනාංකයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සේනාංකයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සේනාංකයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සේනාංකය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික යොවුන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රකිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සේනාංකය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) සහ (ඇ) ඡේදවල සඳහන් කරුණු හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සේනාංකයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සේනාංකය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ජාතික යොවුන්

සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2003 ජූනි 02 දිනැති අංක පිරිඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය	
(i) 5.1 ඡේදය	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර සේනාංකය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ii) 6.5.1 ඡේදය	ගිණුම් වර්ෂය අවසන් වී මාස් 02 ක් ඇතුළත සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් මාස 09 ක් ප්‍රමාද වී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.
(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය	සේනාංකය විසින් 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 2,378 ක් වූ දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඇ) 2022 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 2. (4) වගන්තිය	සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තිය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කාර්ය සඳහා කමිටු 3 ක් පත් කරනු ලැබිය යුතු වන අතර සභාව විසින් ස්වකීය බලතල ඒ කමිටුවලට පවරනු ලැබිය හැකි බව සඳහන් කර තිබුණ ද ජාතික යොවුන් සේනාංකය විසින් සේනාංකය ආරම්භ කළ 2002 වර්ෂයේ සිට එපරිදි කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික යොවුන් සේනාංකයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික යොවුන් සේනාංකයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

(අ) මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ වල දක්වා ඇති සේනාංකයෙන් පරිබාහිර ආයතනයක් වූ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2015 සිට 2021 දක්වා පරිහරණය කරන ලද විදුලි හා ජල පරිභෝජනයට අදාළව හා විවිපනම් වෙනුවෙන් අයවිය යුතු රු. මිලියන 14 ක් සහ වෙන්නප්පුව පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම් වෙනුවෙන් අදාළ ඉදිකිරීම් ආයතනයට වැඩිපුර ගෙවා තිබූ රු. මිලියන 2ක් 2022 සැප්තැම්බර් 15 දින ඛන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසරකට වඩා වැඩි කාලයක සිට පැවත එන වෙනත් ගෙවිය යුතු දෑ යටතේ දක්වා ඇති බැහැරගත පුහුණු වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 1ක් සහ වසර තුනකට වඩා වැඩි කාලයක සිට පැවත එන 2021 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. මිලියන 1.4 ක් 2022 සැප්තැම්බර් 20 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කරන ලද පුහුණු මධ්‍යස්ථාන 04 ක් හා මූලික වැඩ ප්‍රමාණපත් වල අඩුපාඩු පැවතීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා ඇති ගෝමරන්කඩවල පුහුණු මධ්‍යස්ථානයේ පෙරසවි ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා ලබා දී තිබුණු එකතුව රු. මිලියන 62.6 ක් වූ ඉදිකිරීම් අත්තිකාරම් මේ වන තෙක් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 අගෝස්තු 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානය වෙත ජාතික යොවුන් සේනාංකයේ නව මධ්‍යස්ථාන 10 ක් හා පවතින මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඒකක 21 ක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව ලබා දී තිබුණි. ඉදිකිරීම් ප්‍රගතියේ අසාර්ථකත්වය හේතුවෙන් 2020 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත් අවලංගු කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවත් ජාතික යොවුන් සේනාංකය විසින් එම සංවිධානය වෙත 2016 හා 2017 වර්ෂ වලදී ලබාදී තිබුණු රු. මිලියන 109.2 ක් වූ මුළු අත්තිකාරම් මුදලින් රු. මිලියන 37.6ක් මෙම ඉදිකිරීම් කටයුතු අවලංගු කර වසර දෙකක් ගත වී තිබියදීත් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ජාතික යොවුන් සේනාංකයේ ප්‍රධාන කාර්යාලයේ භාවිතා වන ලියාපදිංචි අයිතිය වෙනත් අමාත්‍යාංශ හා ආයතන සතු වටිනාකම රු. මිලියන 31.5ක් වූ වාහන 08 ක් මෙතෙක් සේනාංකය නමින් පවරාගෙන නොතිබුණි.

(ඊ) 2021 දෙසැම්බර් 31 දිනට පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති සහ සේනාංකයට පවරාගත හැකි ඉඩම් 62 ක් අතරින් ඉඩම් 19 ක් පමණක් සේනාංකයට පවරාගෙන තිබුණු අතර ඉතිරි ඉඩම් 43 හි පවරා ගැනීම් කටයුතු මෙතෙක් නිම වී නොතිබුණි.

(උ) 2017 වර්ෂයේ දී වැඩ ආරම්භ කරන ලද 2021 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කරන ලද කෙරිගෙන යන වැඩ තුළ ඇතුළත් රු. මිලියන 20ක් වූ පුහුණු මධ්‍යස්ථාන 02 ක් සහ රු. මිලියන 3.7ක් වූ ගෝමරන්කඩවල පෙරසව් ගොඩනැගිල්ලෙහි ඉතිරි ඉදිකිරීම් කටයුතු 2022 ඔක්තෝබර් 31 දින තෙක් නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2011 දෙසැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රටේ තරුණ ප්‍රජාව බල ගැන්වීමේ කාර්යය වඩාත් හොඳින් හා ඵලදායීව ඉටු කිරීම සඳහා ඊට ගැළපෙන පරිදි පවතින යොවුන් සේනාංක පනත පරිච්ඡින්න කර නව පනතක් සම්මත කර ගත යුතු වුවද ඒ සඳහා වසර 11 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(එ) 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 18 වන වගන්තිය යටතේ සාදන ලද 2003 ඔක්තෝබර් 10 දිනැති නියෝගවල 4 (ii) ප්‍රකාරව සේනාංකය විසින් ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ ඉලක්ක කර විවිධ ක්ෂේත්‍ර වල පවතින ජාතික වෘත්තීය සුදුසුකම් පුහුණුලාභීන්ට ලබාගත හැකි පාඨමාලා රජයේ වෘත්තීය පුහුණු ආයතන හා ඒකාබද්ධව සකස් කර පුහුණුලාභීන් යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) සේනාංකය විසින් පෞද්ගලික ආයතන 66 ක පාඨමාලා 132 ක් හා රජයේ වෘත්තීය පාඨමාලා 20 ක් හැදෑරීම සඳහා පමණක් වෘත්තීය පුහුණුව ලබාදීමට පුහුණුලාභීන් යොමු කර තිබුණි. ඒ සඳහා එක් පුහුණුලාභියෙක් සඳහා රු. 100,000 ක උපරිම පුහුණු ගාස්තුවක් නියමකර තිබුනද පිරිවැය රු.100,000 ත් රු. 800,000 ත් අතර පරාසයේ පාඨමාලා ගාස්තු ගෙවා පුහුණුලාභීන් හදාරා තිබුණි. තවද වෘත්තීය පාඨමාලාවලට යොමු කරන පුහුණුලාභීන් පාඨමාලාව අවසන් කර රැකියා ගත වනතුරු අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක්ද සේනාංකය විසින් සකස් කර නොතිබුණි.

ඩබ්.පී.ජී.චිත්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති වාර්තා පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ



ජාතික යොවුන් සේනාංකය
தேசிய இளைஞர் படையணி
NATIONAL YOUTH CORPS

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය விளையாட்டு மற்றும் இளைஞர் அமைச்சு Ministry of Sports and Youth Affairs

ඔබේ අංකය/எனது இல/My No : YC/5/10/Audit
මගේ අංකය/உமது இல/My No : SYA/A/NYC/1/21/14

දිනය/திகதி/Date : 2022/11/

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල.

ජාතික යොවුන් සේනාංකයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලින් බැහැර වීම

(i) යොවුන් සේනාංකය සතු රුපියල් 410,208,852/- ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී.ල.රා.අ.ගි. ප්‍රමිත අංක 07 හි 65 ප්‍රකාරව කටයුතු කර නොමැති බව පිළිගනිමි. මෙම වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති බැවින්, නැවත ප්‍රත්‍යාගණනය කර 2022 වසරේ ගිණුම් තුල සටහන් තැබීමට කටයුතු කරමි.

(ii) ගිණුම්කරණ ප්‍රතිපත්තිහි මෘදුකාංග හා වෙබ් අඩවි ක්ෂය කිරීම 25% ප්‍රතිශතයක් යටතේ සිදු කිරීමට සහා අනුමැතිය ලබා ගෙන ඇත. එහෙත් ගිණුම් ප්‍රකාශයන්හි ප්‍රතිපත්ති සටහන් කිරීමේදී අතපසුවීමකින් 25% ප්‍රතිශතය සටහන් වී නොමැති බව පිළිගනිමි. මෙම 2022 වසරේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව සටහන් කරමි.

(ආ) මෙමඟින් පෙන්වා ඇති කරුණ 2022 ගිණුම්තුල නිවැරදි කර ඇත.

(ඇ) ගෝමරන්කඩවල, ගම්පොළ, මොණරාගල අදියර i, මොණරාගල අදියර ii, මොණරාගල අදියර iii, මොණරාගල අදියර iv, නාවුල ABT, ත්‍රිකුණාමලය යන ජාතික යොවුන් සේනාංක පුහුණු

අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07. இல 420, பௌத்தாலோக்க, மாவத்தை, கொழும்பு - 07 No -420, Bauddhaloka mawatha, Colombo- 07
දුරකථන/தொலைபேசி/Telephone - 0112688885/2669237 ෆැක්ස්/பெக்ஸ்/Fax - 0112684784 විද්‍යුත් තැපෑල/மின்-அஞ்சல்/Email - info@youthcorps.lk වෙබ් අඩවිය/இணைய தளம்/web - www.youthcorps.lk

සභාපති
தலைவர்
Chairman
Tel: 0112 690 293

අතිරේක අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය)
மேலதிக பணிப்பாளர் (நிருவாகமும் நிதியும்)
Additional Director (Administration and finance)
Tel: 0112 688 885

අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)
மேலதிக பணிப்பாளர் (பயிற்சியும் அபிவிருத்தியும்)
Additional Director (Training and Development)
Tel: 0113 168 837

මධ්‍යස්ථාන සම්බන්ධව රු:518,467,445/- ක් මුල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා ඇත්තේ මෙම පුහුණු මධ්‍යස්ථාන වල ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2021.12.31 වන විට අවසන් කර ඇති නමුත් අවසන් ගෙවීම් බිල්පත් 2021 වර්ෂයේ 12/31 දිනට ඉදිරිපත් වී නොමැති හෙයිනි. ඒ අනුව ගෝමරන්කඩවල ත්‍රිකුණාමලය යන පුහුණු මධ්‍යස්ථාන වල අවසන් බිල්පත් නිරවුල් කිරීම 2022.06.01 දින සිදු කර ඇති අතර මොණරාගල අදියර iv බිල්පත් නිරවුල් කර ඇත්තේ 2022.01.18 ය. ඒ අනුව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රාග්ධනිත කර ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කර ඇත.

(ඇ) මෙමඟින් ඉදිරිපත් කර ඇති පුහුණු මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් කටයුතු පුනුරුත්තාපන වැඩසටහන් යටතේ ඉදිකිරීම් නිමකර අවසන් බිල්පත් ද නිරවුල් කර ඇත.

(ඉ) තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, දෙහිඅත්තකණ්ඩිය යන ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය සම්බන්ධව රු:226,028,860/- ක් මුල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ ලෙස දැක්වුවද මෙම පුහුණු මධ්‍යස්ථාන වල ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2021.12.31 වන විට අවසන් කර මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ඇත. එහෙත් මෙම මධ්‍යස්ථානයන්හි අවසන් බිල්පත් නිරවුල් කර නොමැත. මේ වන විට අවසන් බිල්පත් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බැවින්, ඒවා 2022 මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඊ) 2021.12.31 වන විට උප කොන්ත්‍රාත්කරුවන් මඟින් වැඩ අවසන් කර ඇති අතර මෙම පුහුණු මධ්‍යස්ථාන වල ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ අවසන් කිරීමේ සහතිකයන් විගණන විමසුම් මඟින් ඉදිරිපත් කර ඇත. එම මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් ප්‍රාග්ධනිත කිරීම 2022 වසරේ සිදු කරනු ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන පිලබඳ කළමණාකණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2.2.2

(i) 5.1 ඡේදය

ජාතික යොවුන් සේනාංකයේ 2023 – 2027 සඳහා වූ ආයතනික සැලැස්මේ කොටුම්පත සකස් කර එහි සංස්කරණ කටයුතු සඳහා මේ වන විට විශේෂඥ උපදේශකවරයෙකු වෙත යොමු කර ඇති බව සඳහන් කරමි.

(ii) 6.5.1 ඡේදය

2021 වසරේ මූල්‍ය ප්‍රකාශන 2022 වසරේ මැයි මස වන විට සකස් කර අවසන් කර, එය ජුනි මස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එම ප්‍රමාදය 2022 වසරේ ගිණුම් සකස්

කරන විට අවම කරමින්, නිශ්චිත කාල සීමාව තුල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

2.2.4

(අ) **<u>වාහන කළමණාකරණය</u>**

විගණනය මගින් පෙන්වා දී ඇති ජාතික යොවුන් සේනාංකයට අයත් වාහනවල ලියාපදිංචි අයිති සඳහා අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර ඒවායේ සීඝ්‍ර ප්‍රගතියක් නොමැති වුවත් ඒ ඒ අවශ්‍යතාවයන් අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරමින් සිටී.
මෙම වාහන ඒ ඒ වකවානුවල විවිධ අමාත්‍යාංශයන් යටතේ පැවැතීමත් වර්තමානය වන විට එම අමාත්‍යාංශ වෙනත් නාමයන් යටතේ හැදින්වීමත් ආදී කරුණු රැසක් හේතුවෙන් අදාල වාහනයන්හි ලියාපදිංචි මුල් පිටපත් ලබා ගැනීමට ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. මෙවැනි කරුණු රැසක් හේතුවෙන් මෙම වාහන ජාතික යොවුන් සේනාංකය වෙත පවරා ගැනීම යම්තාක් දුරට ප්‍රමාද වී ඇති බව සඳහන් කරමි.

(ආ) **<u>කළමණාකාරණ අකර්යක්ෂමතා</u>**

(i) ජාතික යොවුන් සේනාංකයේ හෝටල් පුහුණු පාසල, බැහැරගත පුහුණු මධ්‍යස්ථානය හා ඉදිකරමින් පවතින මධ්‍යස්ථාන ඇතුළුව මුළු මධ්‍යස්ථානය ප්‍රමාණය පහත පරිදිය.

දැනට ක්‍රියාත්මක පුහුණු මධ්‍යස්ථාන	57
බැහැරග පුහුණු මධ්‍යස්ථානය	01
හෝටල් පුහුණු පාසල	01
ඉදි කරමින් පවතින මධ්‍යස්ථාන	<u>06</u>
එකතුව	**<u>65</u>**

ඉහත මධ්‍යස්ථාන අතුරින් බැහැගත පුහුණු මධ්‍යස්ථානය හා නාවුල පුහුණු මධ්‍යස්ථානය යන මධ්‍යස්ථාන 02 ම එක් ඉඩමක පිහිටා ඇත. එමෙන්ම සූරියවැව ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සූරියවැව මහවැලි සංකීර්ණයේ කොටසක පවත්වාගෙන යනු ලබයි. එමෙන්ම කිලිනොච්චිය මධ්‍යස්ථානය කිලිනොච්චිය දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ කොටසක පවත්වාගෙන යනු ලබයි.

ඒ අනුව මෙම මධ්‍යස්ථාන පිහිටි ඉඩම් අතුරින් පවරාගත හැකි ඉඩම් ප්‍රමාණය 62 කි. එම ඉඩම් 62 න් මේ වන විට ඉඩම් 19 ක පවරාගැනීම් කටයුතු සිදු කර ඇති අතර ඉතිරි ඉඩම් 43 පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. මෙම ඉඩම් 43 න් ඉඩම් 17 ට අදාළ පවරා ගැනීම් කටයුතු යම් තාක් දුරට අවසන් වී ඇති අතර එයින් ඉඩම් 07 ක පවරාදීම් ප්‍රාදේශීය ලේකම්වරුන් හා පළාත්

ඉඩම් කොමසාරිස්වරුන් විසින් නිර්දේශ කර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතද ඉදිරිපත් කර ඇත.

එමෙන්ම ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉඩම් පවරා ගැනීම පිළිබඳව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවති අතර එම සාකච්ඡාවේදී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පෙන්වා දෙනු ලැබුයේ දැනට පවරාගැනීම් කටයුතු යම් තාක්දුරට අවසන් වී ඇති ඉඩම් ඒඅනුව පවරා ගැනීම් අනෙකුත් ඉඩම් රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ සියයට භාගයක (1/2%) නාමික බදු මුදලක් යටතේ නිදහස් කර ගැනීම සුදුසු බවත්ය.

ඒ අනුව එලෙස පවරාගැනීම් කටයුතු වල මුල් අදියරේ පවතින ඉඩම්, රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ සියයට භාගයක (1/2%) නාමික බදු මුදලක් යටතේ නිදහස් කර ගැනීමට කටයුතු කර දෙන මෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ඉල්ලීම් කර ඇත. මේ වන විට එම ඉල්ලීම් ඉඩම් කොමාසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉදිරිපත් කරමින් පවතී.

(ii)

මධ්‍ය ස්ථානය	**2021.12.31** දිනට කෙරීගෙන යන වැඩ තුළ ඇතුළත් වටිනාකම (රු:)	ගිවිසුම අවලංගු කිරීමට හේතුව
කොටපොළ	18,149,844.00	මෙම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් මන්දගාමී ස්වභාවය හේතුවෙන් ගිවිසුම අවලංගු කරන ලදී. කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට ඇති ඉතිරි අත්තිකාරම් මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති වෙත ඉදිරිපත් කර ඇත. මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශ ලේකම් තුමාගේ අනුමැතිය පරිදි වෘත්තීය පුහුණු අධිකාරිය වෙත භාර දීමට කටයුතු කර ඇත.
කල්පිටිය	1,826,345.00	කල්පිටිය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර ඇත. අදාළ කොන්ත්‍රාත් ආයතනය බැංකුව වෙත තබා තිබූ කාර්ය සාධන හා අත්තිකාරම් ඇපකරයන්හි මුදල් ජාතික යොවුන් සේනාංකය වෙත අය කර ගන්නා ලදී.
ගෝමරන්කඩවල පෙරසවි ගොඩනැගිල්ල	3,692,442.00	ගෝමරන්කඩවල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමට ප්‍රථම පෙර සවි පුහුණු මධ්‍යස්ථානයක් එම ස්ථානයේ

		ඉදිකිරීමට කටයුතු කර ඇත. නමුත් ගෝමරන්කඩවල නව පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේදී පෙර සවි ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නැවතී ඇත. මෙම ඉදිකිරීමෙහි මූලික ප්‍රමාණපත්හි අඩු පාඩුවක් ඇති බව හඳුනාගෙන ඇති අතර එම අඩුපාඩු සකස්කර ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන අනුව එම ගොඩනැගිල්ලේ ඉතිරි කටයුතු සිදුකර බිල්පත් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. එමඟින් අත්තිකාරම් මුදල ද නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) <u>අමාත්‍ය මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක නොවීම.</u>

(i) ජාතික යොවුන් සේනාංකයේ සිදුකල යුතුව තිබූ ඉදිකිරීම් නව මධ්‍යස්ථාන 10 ක් සහ පවතින මධ්‍යස්ථාන ගොඩනැගිලි ඒකක 21 ක් හා E1,E2 වැසිකිලි පද්ධති 32 ක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත 2016,2017 වසරවල ලංසු කැඳවීමකින් තොරව පිරිනමා තිබුණි.එහෙත් මෙම ඉදිකිරීම් අදාළ ආයතනය විසින් නිසි ප්‍රගතියක් පෙන්නුම් කර නොමැති හෙයින් 2020 ජනවාරි 30 දිනැති අංක 20/0166/220/007 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අදාළ කොන්ත්‍රාත් ගිවිසුම් අවලංගු කරන ලදි.එමෙන්ම එම ඉදිකිරීම් වලින් 50% ට වැඩි ප්‍රගතියක් ඇති ඉදිකිරීම් උප කොන්ත්‍රාත්කරුවන්ට ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණි.ඒ අනුව 50% ට වැඩි ප්‍රගතියක් ඇති ඉදිකිරීම් ගොඩනැගිලි ඒකක 13 කින් 11 ක්ද E 1 වැසිකිලි පද්ධති 3 ක් ද උප කොන්ත්‍රාත් කරුවන් වෙත පිරිනමා ඉදිකිරීම් අවසන් කර ඇත.

එමෙන්ම ඉහත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන්ම 50% ට අඩු ප්‍රගතියක් ඇති ඉදිකිරීම් නැවත ඇස්තමේන්තුගත කර ටෙන්ඩර් කිරීමටත් අනුමැතිය ලබා දුනි.එහෙත් පසුව 50% ට අඩු ප්‍රගතියක් ඇති ගොඩනැගිලි ඒකකද උප කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉදිකර ගන්නා ලෙස අමප/21/1527/329/026 දරන 2021.09.07 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් නැවත අනුමැතිය ලබා දෙන ලදි.ඒ අනුව 50% ට වඩා අඩු ප්‍රගතියක් ඇති සුරියවැව පුහුණු මධ්‍යස්ථානයේ E 1 වැසිකිලි පද්ධතිය උප කොන්ත්‍රාත්කරු ලවා ඉටු කර ගන්නා ලදි.

තවද ,මෙම නවතා දමන ලද ඉදිකිරීම් සියල්ලක්ම 2021 වසරෙහි ඉදිකිරීම් නිම කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කළද, රාජ්‍ය ව්‍යයදම් කළමනාකරණය කිරීම යටතේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022.04.26 දිනැති චක්‍රලේඛයට අනුව ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රමුඛත්වය දිය යුතු ව්‍යාපෘති සිදුකල බැවින් 50% ට අඩු ප්‍රගතියක් ඇති ඉතිරි ඉදකිරීම් ඉදිරි වසර 5 සඳහා ප්‍රමුඛත්වය මත ඉදිකිරීමට සැලසුම් කර ඇත.

(ඇ) <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(i) වෙන්නප්පුව ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම්හි අමතර වැඩ විෂයයන් සඳහා රු:4,162,172.06 (බදු සහිත) මුදලක් ඇන්තනී බිල්ඩර්ස් ආයතනය වෙත වැඩිපුර ගෙවීම් සිදු කර ඇත.අදාළ ඉදිකිරීම්හි බිල්පත් ගෙවීම් සිදුකිරීමේදී ජාතික යොවුන් සේනාංකය වෙතින් රු:2,186,129.50 (බදු සහිත) මුදලක් රැඳවුම් මුදල් වශයෙන් තබා ගෙන ඇත. අදාළ රැඳවුම් මුදලින් එම මුදල අයකර ගැනීමට කටයුතු කරන ලෙස මූල්‍ය අංශයට දැනුම් දී ඇති අතර ඉතිරි මුදල වන රු:1,976,042.56 ක මුදල අදාළ කොන්ත්‍රාත් ආයතනය මඟින් සිදු කරන ලද ව්‍යාපෘතියක් වන මහනැගුම ආයතනය වෙතින් අයකර ගන්නා ලෙස එම ආයතනය මඟින් මෙම මුලස්ථානයට දැනුම් දී ඇත. ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය ද මේ සම්බන්ධව දැනුවත් කර ඇති අතර අමාත්‍යාංශය මඟින් ද මේ සම්බන්ධව මහනැගුම ආයතනය දැනුවත් කර ඇත. ඒ සබැඳි ලිපිය ඇමුණුම් '01' වශයෙන් ඉදිරිපත් කර ඇත.

(ii) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙතින් ජල විදුලි හා වරිපනම් වෙනුවෙන් 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අය විය යුතු රුපියල් 13,144,155/57 ක මුදල වාර්ෂික ගිණුම් වලින් කපා හැරීම සඳහා ජාතික යොවුන් සේනාංක විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර එහිදී ලද නිර්දේශ මත යොවුන් සේනාංක සභා අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව 2022 වර්ෂයේ ගිණුම් හි අදාල ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි.

තවද 2021 වර්ෂයේ සිට කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් අදාල බිල්පත් වටිනාකම මාසිකව නිරවුල් කිරීම සිදු කරනු ලබයි.

(iii) නිරවුල් නොකර පැවැති ලෙස පෙන්වා ඇති රුපියල් 1,006,529/80 - ක වටිනාකම 2022 වර්ෂයේ පොත් වලින් කපා හැරීම් සිදු කර ඇත.

(iv) උපචිත වියදම් යටතේ නිරවුල් නොකර පැවැති රු 1,426,321/- ක ශේෂය පහත දක්වා ඇති පරිදි නිරවුල් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2022 ගිණුම්හි ඇතුලත් කරනු ඇත.

වර්ෂය	වියදම	විස්තරය	මුදල	ප්‍රගතිය
2018	Furniture & office equipment (capital)	Richco Associated	15,985.00	2022 වර්ෂයේ දී ආදායමට ගෙන ඇත.
2019	Building structure payable	Ceylon Engineering	1,335,636.00	අදායමට බැර කර ඇත.
2019	Building Rehabilitation	P.D.R. Siriwardhana	74,700.00	ගෙවීම සඳහා ඉදිරි උපදෙස් ලබා ගැනීමට සහා පත්‍රයක් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරනු ඇත.
එකතුව			**1,426,321.00**	

(ඉ) <u>ලැබිය යුතු අත්තිකාරම්</u>

(i) ගම්පොළ පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරිමහි 2021.12.31 වන දින වන විට ඉදිකිරීම් අවසන් කර තිබූ අතර අවසන් බිල්පත් නිරවුල් කර නොතිබුණි. ඒ අනුව නිරවුල් කර ගැනීමට තිබූ අත්තිකාරම් මුදල මෙම කොන්ත්‍රාත්කරු විසින්ම සෙංකඩගල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සිදු කර තිබූ අතර මෙම ඉදිකිරීම් දෙකෙහිම රැඳවුම් මුදල් සහ අවසන් බිල්පත් නිරවුල් කිරීමේදී ගම්පොළ ඉදිකිරීමේදී නිරවුල් කළ යුතුව තිබූ රු:4,698,452.50 ක මුදල 2022 වසර තුල නිරවුල් කර ඇත.

(ii) වැලිමඩ, මීගහකිවුල, කොටපොළ, පැල්මඩුල්ල යන පුහුණු මධ්‍යස්ථාන වල ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කරන ලදී. ඒ අනුව වැලිමඩ, මීගහකිවුල යන පුහුණු මධ්‍යස්ථාන වල අත්තිකාරම් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් නිරවුල් කරුවෙකු (Adjudicator) වෙත ඉදිරිපත් කල අතර එම තීරණය 2022.02.28 දින ලබා දෙන ලදී.එම තීරණයට ආදාළ කොන්ත්‍රාත්කරු එකඟ නොවූ හෙයින් දෙපාර්ශවයේ එකඟතාවය මත බෙරුම්කරුවෙකු (Arbitration) පත් කර ගන්නා ලදී. ඒ සඳහා ඉදිරි කටයුතු සිදුවෙමින් පවතින අතර එහි පළමු රැස්වීම 2022.10.26 දින පැවැත්වූ අතර ඊළඟ රැස්වීම 2023.03.14 දින පැවැත්වීමට නියමිතය.
කොටපොළ පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම් අවලංගු කර ඇති අතර අදාළ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට අදාළ ගොනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

පැල්මඩුල්ල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවලංගු කර ඇති අතර, අදාළ කොන්ත්‍රාත්කරු දඹුල්ල (දිගම්පතන) ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන බැවින් පැල්මඩුල්ල ජාතික යොවුන් සේනාංකයේ අත්තිකාරම් මුදල එමඟින් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. ඒ අනුව රු:2,000,000.00 ක අත්තිකාරම් මුදලක් 2022.03.15 දඹුල්ල යොවුන් සේනාංකයේ බිල්පත් නිරවුල් කිරීමේදී අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල් ඉදිරි ගෙවීම් වලදී අඩු කර ගැනීමට කටයුතු කරනු ඇත.

ගෝමරන්කඩවල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමට ප්‍රථම පෙර සවි පුහුණු මධ්‍යස්ථානයක් එම ස්ථානයේ ඉදිකිරීමට කටයුතු කර ඇත.නමුත් නව ගෝමරන්කඩවල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේදී පෙර සවි ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නැවතී ඇත. මෙම ඉදිකිරීමෙහි මූලික ප්‍රමානපත්හි අඩු පාඩුවක් ඇති බව හඳුනාගෙන ඇති අතර,නැවත එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා 2023 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත.එමඟින් ඉතිරි අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.

(iii) ජාතික යොවුන් සේනාංකය සවිබල ගැන්වීම හේතුවෙන් 2016 සහ 2014 වර්ෂ වලදී නව මධ්‍යස්ථාන 10 ක් හා පවතින මධ්‍යස්ථාන වල ඉදිකිරීම් ගොඩනැගිලි ඒකක 21 ඉදිකිරීම සඳහා මිළ ගණන් කැඳවීමකින් තොරව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත අමාත්‍යාංශ මණ්ඩල පත්‍රිකාවක් අනුව කොන්ත්‍රාත් පිරිනමා ඇත.එහෙත් අදාළ ආයතනය විසින් ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් 2020 වර්ෂයේදී සියළු ඉදිකිරීම් අවලංගු කරන ලදී.මෙම ඉදිකිරීම් සඳහා එම ආයතනය වෙත ගෙවන ලද අත්තිකාරම් මුදලින් රු:71,618,995 ක් වූ අත්තිකාරම් මේ වන විට නිරවුල් කර ඇත. තව දුරටත් නිරවුල් කළ යුතු රු:37,615,680 ක අත්තිකාරම් මුදල අවසන් බිල්පත් නිරවුල් කිරීමේදී අය කර ගැනීමට කටයුතු කරනු ඇත. එම බිල්පත් නිරවුල් කිරීම සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලිඛිතව සහ වාචිකව කිහිපවතාවක්ම දැනුම් දුන්නද ඒ සඳහා මේ වන තෙක් කිසිදු ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නොමැත.

2.3 <u>වෙනත් කරුණු</u>

(i) ජාතික යොවුන් සේනාංකය 2015 වර්ෂයේ දී මුල් වරට වාර්ෂික ගිණුම් සකස් කිරීම සිදු කල අතර, එම අවස්ථාවේ ස්ථාවර වත්කම් ලේඛණයක් පිළියෙල කරන ලදී.
එය පරිගණක Excell මෘදුකාංගයක් යොදා ගනිමින් සකස් කර පවත්වාගෙන ගිය අතර, එම වර්ෂයෙන් පසු බොහොමයක් නව මධ්‍යස්ථාන ඉදි වූ අතර, එම මධ්‍යස්ථාන සඳහා විශාල වශයෙන් භාණ්ඩ මිලදී ගැනීම් සිදු කරන ලදී.

එම මිලදී ගැනීම් අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීම ප්‍රායෝගිකව ගැටලු සහගත විය .

2021 වර්ෂයේදී සංගීත භාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම් සිදු කල අතර, එහිදී එම භාණ්ඩ වලට අදාලව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. 2022 වර්ෂයේ දී අනෙකුත් භාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම සිදු කරන අතර, ඊට අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.

(ii) 2022 වර්ෂයේ සිට රදවා ගත් මුදල් හා අත්තිකාරම් මුදල් සම්බන්ධව ලේඛනයක් පරිගණකයන්හි Excell හි අන්තර්ගත කොට ඇත. 2023 සිට එම ලේඛනය නඩත්තු කිරීමට කටයුතු කරනු ඇත.

(iv) අමාත්‍යාංශ ගිණුමේ රඳවා රුපියල් මිලියන 17 කට රැඳවුම් මුදල් වලින් අඩකට ආසන්න ප්‍රමාණයකම අවසන් බිල්පත් නිරවුල් වී නොමැති බැවින් ඊට අදාල රැඳවුම් මුදල් ද නිදහස් කිරීම් සිදු කර නොමැති බව පෙන්වා දෙමි. එසේම අනෙකුත් රැඳවුම් මුදල් කඩිනමින් වර්ෂය තුල නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදාල අංශ දැනුවත් කර ඇත.

(v) අංක අමප/11/0157/539/005 හා 2011 පෙබරවාරි මස 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් යොවුන් සේනාංක පනත සංශෝධනය කිරීම සහ අදාල පනත සංශෝධනය කරනු ලබන තෙක් යොවුන් සේනාංකය නෛතික වශයෙන් පිහිටවූ ආයතනයක් ලෙස සලකමින් අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ පරිපාලන හා මූල්‍ය බලතල යොවුන් සේනාංක අධ්‍යක්ෂවරයාට පැවරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව ක්‍රියා කරමින් ජාතික යොවුන් සේනාංකය අධිකාරියක් බවට පත් කිරීම සඳහාවූ ජාතික යොවුන් සේනාංක අධිකාරී පනත කෙටුම්පත් කර 2011 වර්ෂයේදී නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව අවස්ථා කිහිපයකදී මෙම පනත් කෙටුම්පතෙහි සංශෝධන සිදු කර අංක L.D.O 47/2011 දරණ සංශෝධිත කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.

2015 වර්ෂයේ නව රජය පත් වීමත් සමගම සංශෝධිත කෙටුම්පතේ කටයුතු නතර කිරීමට සිදුවී ඇති අතර නැවත 2019 වර්ෂයේ සිට නැවත නීති කෙටුම්පත් සම්පාද දෙපාර්තමේන්තුවේ සහාය ඇතුව සංශෝධිත කටයුතු ආරම්භ කර ඇති බවට නිරීක්ෂණය වේ. ඉදිරි කටයුතු නැවතී තිබියදී ජාතික යොවුන් සේනාංක අධිකාරී පනත ප්‍රමුඛතා පදනම මත කටයුතු කළ යුතු පනතක් බවට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් අධිකරණ අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දීමෙන් පසුව හා අවසන් සංශෝධිත පනත් කෙටුම්පත වශයෙන් සලකා ක්‍රියා කළ අතර වෙනත් සංශෝධන නොමැති බවට 2021.06.30 දිනැති ලිපියෙන් තරුණ හා ක්‍රීඩා

අමාත්‍යාංශයේ ලේකම් විසින් නීති කෙටුම්පත් සම්පාදකවරයා දැනුවත් කර ඇත. පසුව නීතිපති දෙපාර්තමේනතුවෙන් 2021 සැප්තැම්බර් මස 24 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත නිරීක්ෂණ හා සංශෝධන යොමු කර ඇත. එකී සංශෝධන අනුව සකස් කරන ලද කෙටුම්පත 2021 නොවැම්බර් මස 16 දිනැතිව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේනතුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. එකී කෙටුම්පත නිරීක්ෂණය කිරීමෙන් පසුව නීතිපති විසින් මෙම කෙටුම්පතේ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන බවත් දහතුන්වන ආන්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පනවන ලද කිසිදු තහනමකට හෝ සීමාවකට යටත් නොවන අතර එය පාර්ලිමේන්තුව මගින් බලාත්මක කළ හැකි බවටත් 2022 පෙබරවාරි මස 22 වන දිනැති ලිපියෙන් නිර්දේශ කර ඇත.

ඉන් පසුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කරන ලද අතර, එසේ තිබියදී රටේ උද්ගත වූ වාතාවරණයත් සමගම අමාත්‍ය මණ්ඩලයද ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයාද වෙනස් වූ හෙයින් නැවත පසුබෑමකට ලක් විය. මේ වන විට වර්තමාන ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් අමාත්‍යමණ්ඩලය වෙත අදාල කෙටුම්පත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

(v) ජාතික යොවුන් සේනාංක සභාව 2015 වර්ෂයේ ආරම්භ කිරීමෙන් පසුව පනතේ 2(4) වගන්ති ප්‍රකාරව සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා කමිටු 03 ක් පත් කිරීම සඳහා 2015.10.23 දින පැවැති සභා රැස්වීමේදී සභා පත්‍රිකා අංක 33 මඟින් කමිටු පත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා අනුමැතිය ඉල්ලා ඇති අතර, ව්‍යෘත්තීය පුහුණු කමිටුව, යොවුන් සංවර්ධන කමිටුව, ස්ථානපන කමිටුව වශයෙන් කමිටු 03 ක් පත් කර ඇත. ඒ සඳහා සභාවේ සාමාජිකයින් 03 දෙනෙකු ඒ ඒ කමිටු සඳහා 2017 වර්ෂයේදී නිර්දේශ කර ඇත. ඒ අනුව කමිටු 03 ක් පත් කර පවත්වාගෙන ගියද, සභාවේ සාමාජිකයින් වරින් වර වෙනස් වීම මත කමිටු 03 පත් කිරීමට සිදු වීම මත සහ කමිටු සාමාජිකයින් හට ප්‍රතිපාදන වෙන් කිරීමේදී පැන නඟින ලද ගැටලු හේතු කොට ගෙන විධිමත්ව පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇති බව සඳහන් කරමි. කෙසේ වෙතත් නැවත මෙම කමිටු පත් කිරීම සම්බන්ධයෙන් යෝජනාවක් මත 2022 ජනවාරි මස පැවැති සභා රැස්වීමේදී සාකච්ඡා කරන ලදී. එහිදීද ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන් ද ගැටලු සාකච්ඡා කළ අතර, ඉදිරියේදී කමිටු පත් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන බවද ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ඉදිරියේදී ජාතික යොවුන් සේනාංක සභාවේ අනුමැතිය අනුව ක්‍රියාකාරී ලෙස කමිටු පත් කිරීමට කටයුතු යුතුවේ.

(vii) ජාතික යොවුන් සේනාංක ජීවන කුසලතා පාඨමාලව හා සම්බන්ධ වන පුහුණුලාභීන් සඳහා තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි භාෂාව විෂයයන් ඉගැන්වීම් කටයුතු සිදු කරන ලදී. ජීවන කුසලතා පාඨමාලව හා සම්බන්ධ වන පුහුණුලාභීන් සඳහා තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි භාෂාව විෂය සඳහා වටිනාකමක් සහිත සහතිකපත්‍රයක් ලබා දීමේ අරමුණෙන් ශ්‍රී ලංකා

ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය (Sri Lanka International Buddhist Academy-SIBA) ආයතනය හරහා උසස් සහතිකපත්‍ර පාඨමාලාවන් ක්‍රියාත්මක කරන ලදී.

විවිධ අධ්‍යාපන මට්ටම් සහිත පාසල් හැර ගිය උසස් අධ්‍යාපනය සඳහා මාර්ගයක් හිමි නොවූ පුහුණුලාභීන් සඳහා උසස් අධ්‍යාපනයට ප්‍රවිශ්ට වීමට මූලික අඩිතාලමක් ලෙස මෙම පාඨමාලාව හදුන්වා දුන් අතර පාඨමාලා සහතිකය මඟින් අවශ්‍ය මූලික සුදුසුකම් සහිත එම ක්ෂේත්‍රයට කැමැත්තක් සහිත පුහුණුලාභීන් හට SIBA ආයතනයේ තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි භාෂාව පිලිබඳ උපාධි පාඨමාලාවන් සඳහා යොමු වීමට අවස්ථාව සලසා දී ඇත.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් උපාධි පාඨමාලා ක්‍රියාත්මක කිරීමට පමණක් අනුමැතිය ලබා දෙන අතර ඒ සඳහා යම් ආයතනයක් අධ්‍යාපනික ආයතනයක් ලෙස ඊට අදාළ අවශ්‍යතා සම්පූර්ණ කල යුතු අතර ඒ සඳහා විශාල පිරිවැයක් සහ කාලයක් ගත් වීමක් සිදු වේ. එසේම 2002 අංක 22 දරණ පනතට අනුව ජාතික යොවුන් සේනාංකය යොවුන් සංවර්ධනය, රැකියා පුහුණුව, සහ වෘත්තීමය අධ්‍යාපනය මූලික අරමුණු කොටගත් ආයතනයක් බැවින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් උපාධි පාඨමාලා ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් සහ අනුමැතියක් මේ වන තෙක් ලැබී නොමැත. තවද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින්ද කෙටි කාලින පාඨමාලාවන් (සහතිකපත් සහ ඩිප්ලෝමා) සඳහා මේ වන තෙක් අනුමැතියන් ලබා නොදෙන බැවින් සෘජුවම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් කෙටි කාලින පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීම සඳහා අවකාශයක් නොමැත.

තරුණ තරුණියන් සඳහා කෙටි කාලින පාඨමාලා ක්‍රියාත්මක කරන රාජ්‍ය ආයතන තිබුණද එම ආයතන සඳහා යොමු නොවී ජාතික යොවුන් සේනාංක පාඨමාලා සඳහා යොමු වීම පුහුණුලාභීන්ගේ කැමැත්ත මත තීරණය වන කරුණකි. එවැනි පාඨමාලා ක්‍රියාත්මක කරන්නා වූ රාජ්‍ය ආයතන වල තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාවන් සඳහා පුහුණුලාභීන් යොමු කිරීමේදී අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වීම අවම සුදුසුකමක් ලෙස සලකන අතර අප වෙත පැමිණෙන පුහුණුලාභීන්ගෙන් බහුතරයක් පාසල් හැරගිය, අ.පො.ස. සාමාන්‍ය පෙළ/ උසස් පෙළ අසමත් දරුවන් වන බැවින් පාඨමාලා හා සම්බන්ද වී ඉගෙනුම් කටයුතු කිරීමට ඇති අවස්ථාව බහුතර පිරිසකට අහිමි වනු ඇත. එමඟින් තරුණ තරුණියන් ඉච්ඡාභංගත්වයට, තරුණ අසහනයට පත්වීමෙන් සමාජ විරෝධී ක්‍රියාවලින්ට පෙළඹීම හේතුවෙන් රට තුළ සමාජීය සහ ආර්ථිකමය ගැටළු රාශියක් පැන නැගීමේ ප්‍රවණතාවක් ඇත.

එවැනි රාජ්‍ය ආයතන හරහා තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ආයතනික ව්‍යුහයන් තුළ අවශ්‍ය අනුමැතියන් සමඟ රාජ්‍ය ආයතන දෙකක් ගිවිසුම් ගත වීමේදී ආයතන ස්ථාපිත ව්‍යුහයන්, වක්‍රලේඛ සහ කොන්දේසි එකිනෙකට ගලපා ඊට අදාළ අනෙකුත් අදාළ ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම වෙනුවෙන් දීර්ඝ කාලයක් ගත වේ. එලෙසම අප වෙත පැමිණෙන පුහුණුලාභීන් සඳහා පිළිගත් සහ උපාධි මට්ටම දක්වා යොමු විය හැකි පාඨමාලා ලබාදීම වෙනුවෙන් එවැනි දීර්ඝ

කාලසීමාවක් වැය කිරීම තුළින් කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබාදීමට සහ අපගේ අරමුණ වන පිළිගත් සහ උපාධි මට්ටම දක්වා ලභා විය හැකි මට්ටමේ සහතිකපත්‍රයක් ලබාදීමට ඇති ඉඩකඩ අභිමිවීමක්ද සිදු වේ.

(viii) 2021 වර්ෂයේ 10,000 ක බඳවා ගැනීමක් අපේක්ෂා කළද සත්‍ය වශයෙන් බඳවා ගැනීම් සිදු කරන ලද්දේ 8043ක් පමණි. 2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රවර්තන වර්ෂයට අදාලව 3300ක පමණ ප්‍රමාණයකට මුදලින් රු 100,000/= ක ශිෂ්‍යත්වයක් යටතේ වෘත්තීය පුහුණුව ලබා දීමට අපේක්ෂා කරන ලදී. ඒ අනුව, ජාතික යොවුන් සේනාංකය මගින් එක් කණ්ඩායමක් සඳහා එක් පුහුණු මධ්‍යස්ථානයකින් විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරා ගන්නා ලද පුහුණුලාභීන් 30 දෙනකු බැගින් වෘත්තීය පුහුණුව සඳහා යොමු කරන ලදී. ඒ සඳහා මධ්‍යස්ථාන මට්ටමින් ක්‍රියාත්මක වෘත්තීය පුහුණුව ලබා දීමේ ක්‍රමවේදයට අවශ්‍ය නිර්ණායක ඇතුළත් උපදෙස් පත්‍රිකාව (ඇමුණුම 02) පරිදි ඉදිරිපත් කරමි.

මෙම ශිෂ්‍යත්වය ලැබීම සඳහා සුදුසුකම් නොලබන පුහුණුලාභීන් සඳහා රජය විසින් නොමිලේ පවත්වනු ලබන වෘත්තීය පාඨමාලා සඳහා යොමු වීමට අවස්ථාව ලබා දෙන ලදී. ජාතික යොවුන් සේනාංකයේ මූලික පාඨමාලාව හදාරා වෘත්තීය පුහුණුවට යොමු නොවීමට අදාල හේතූන් ලෙස පුහුණුලාභීන් උසස් අධ්‍යාපනයට යොමුවීම, රැකියා ගත වීම, ස්වයං රැකියා හෝ ව්‍යාපාර කටයුතු සඳහා යොමු වීම, හෝ විදේශ ගත වීම් ආදී හේතූන් ලෙස දැක්විය හැකිය.

අපේක්ෂිත සිසුන් ප්‍රමාණයක් වෘත්තීය පුහුණුව සඳහා යොමු කර ගැනීමට නොහැකිවීමේ මූලික ගැටලුව ලෙස COVID -19 වසංගත රෝග තත්ත්වය මූලික ලෙස බලපාන ලදී. තවද සුදුසු කාල සීමාවන් වලදී රජයේ විභාග නොපැවැත්වීම (අ.පොස.ස.උ.පෙ./අ.පොස.ස.ස/පෙ), සංචරණ සීමා පැනවීම, ප්‍රවාහන ගැටළු හා වෘත්තීය පුහුණු ආයතන වල පාඨමාලා ආරම්භ කිරීම අපේක්ෂිත කාල පරිච්ඡේදයන්හි සිදු නොවීම මගින් ද සිසුන් බඳවා ගැනීමට හා වෘත්තීය පුහුණුවට අපේක්ෂිත ලෙස යොමු නොවීමට හේතු විය.

(ix) ජාතික යොවුන් සේනාංකය මගින් මුදල් ගෙවා වෘත්තීය පුහුණුව ලබා දීමට එක් කණ්ඩායමක එක් පුහුණු මධ්‍යස්ථානයකින් ළමුන් 30 දෙනෙකු සඳහා විධිමත් ක්‍රමවේදයක් යොදා ගන්න ලදී. තෝරා ගත් එක් සිසුවෙකු සඳහා උපරිමය රු 100,000/-ක පදනම මත ශිෂ්‍යත්වයක් ලබා දීම සිදු කරන ලදී. සභාපතිතුමාගේ හා සභාවේ අනුමැතිය පරිදි සිසුන් සඳහා පාඨමාලා තෝරා ගැනීමට අවසර ලබා දෙන ලදී. එහිදී පාඨමාලා ගාස්තුව 100,000/-ක් හෝ ඊට වැඩි මුදලක් නම් ජාතික යොවුන් සේනාංකය විසින් 100,000/-ක උපරිමයක්ද ඊට අඩු මුදලක් නම් එම සම්පූර්ණ මුදල ද ගෙවන ලදී. පාඨමාලා හදාරනු ලබන සිසු සිසුවියන් සඳහා ගෙවීම් සිදු කිරීමේදී පාඨමාලාව අවසන් වනතෙක් පසු විපරම් සිදු කරනු ලබන අතර ඉදිරියේදී රැකියා ගත වීම සම්බන්දයෙන් ද සිදු කල යුතු පසු විපරම් සඳහා මේ වන විට තොරතුරු එක් රැස් කිරීම උදෙසා පසු විපරම් පත්‍රිකාවක් සකස් කරමින් පවතී. එයට අදාල ආකෘති පත්‍රය (ඇමුණුම 03)

වශයෙන් ඉදිරිපත් කරමි. ඔබ විසින් සඳහන් කර ඇති ගැටළු පිළිබඳ විශේෂ අවධානය යොමු කර නැවත එම ගැටළු සිදු නොවීමට වග බල ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

(x) 2021 වර්ෂය තුළ කොවිඩ්19 වසංගත තත්ත්වය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම තුළ, මෙම කාල සීමාව තුළ ආරම්භ කරන ලද පාඨමාලා අධ්‍යයන කටයුතු අකණ්ඩව සිදු කරගෙන යාමට නොහැකි වූ අතර, මධ්‍යම රජය විසින් පනවන ලද සෞඛ්‍ය නීතිරීති මත පුහුණු මධ්‍යස්ථාන තාවකාලිකව වසා දැමීමට සිදු විය. මෙම වර්ෂය තුළ රටේ පැවති අභියෝගතා හමුවේ, ජාතික යොවුන් සේනාංකය විසින් ප්‍රථම වරට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අධ්‍යන කටයුතු ආරම්භ කරන ලදී. මූලාරම්භයක් වශයන් ආරම්භ කරන ලද මෙම මාර්ගගත ක්‍රමවේදය වඩාත් සාර්ථක කර ගැනීමේ අරමුණින් පුහුණුලාභීන්/ ලාභිනියන් සඳහා නොමිලේ සිම්පත් හා නිදහස් දත්ත (online data) ලබා දීමට කටයුතු කරන ලදී. මේ හරහා පාඨමාලා අධ්‍යයන කටයුතු අඛණ්ඩව සිදු කිරීමටත් නියමිත කාල සීමාව තුළ අධ්‍යයන කටයුතු සිදු කර සාර්ථකව පාඨමාලා අවසන් කිරීමටත් අවස්ථාව උදා විය.

මාර්ගගත ක්‍රමවේදය හරහා අධ්‍යන කටයුතු සිදු කිරීමේදී, පුහුණුලාභීන්/ ලාභිනියන් සඳහා ප්‍රාදේශීය වශයෙන් දුරකථන සංඥා (signal) දුෂ්කරතා මෙන්ම ආර්ථිකමය වශයෙන් දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වීම හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පාඨමාලාව අත්හැර ඇති බව වාර්තා විය. එමෙන්ම, එම කාල වකවානුව තුළ රටේ පැවති කොවිඩ්19 තත්ත්වය අනුව පුද්ගල දුරස්ථභාවය පවත්වා ගැනීම හා සෞඛ්‍ය නීති රීති වලට අනුකූලව කටයුතු කළ යුතු වීම ආදී හේතූන් මත පුහුණු කටයුතු සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි වූ නමුත්, කොරෝන වසංගත තත්වය හමුවේ වුවද පාඨමාලා අධ්‍යයන කටයුතු මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සාර්ථකව අවසන් කිරීමට හැකි වීම තුළ අපේක්ෂිත අරමුණු යම්තාක් දුරකට සාර්ථක කර ගැනීමට හැකි වූ බව කාරුණිකව දන්වා සිටීම.

(xi) ජාතික යොවුන් සේනාංකය විසින් 2022 වර්ෂයේ සිට භාෂා පුහුණුව ලබා දීම ආරම්භ කරන ලදී. ඒ අනුව චීන ජපන් සහ කොරියන් භාෂා ඉගැන්වීම් කටයුතු පහත සඳහන් පරිදි සිදු කරනු ලබයි.

භාෂා පාඨමාලා	පළාත	දිස්ත්‍රික්කය	පුහුණු මධ්‍යස්ථානය	සහභාගී වන සිසුන් ප්‍රමාණය
ජපන් භාෂාව - (JLPT 04/NAT 04)	සබරගමුව	කෑගල්ල	ගලිගමුව	36
	මධ්‍යම	මහනුවර	ගම්පොල	35
	උතුරු මැද	අනුරාධපුර	ගලෙන්බිඳුනුවැව	37
	දකුණ	හම්බන්තොට	වීරකැටිය	34
	බස්නාහිර	ගම්පහ	දිවුලපිටිය	42

		කොළඹ	මූලස්ථානය	62
			රාජගිරිය	86
	මාර්ගගත ක්‍රමවේදයට අනුව පවත්වනු ලබන පාඨමාලාව (online)			45
පාඨමාලාව හදාරනු ලබන පුහුණු ලාභීන් ප්‍රමාණය				**377**
චීන භාෂාව	මධ්‍යම	මහනුවර	සෙංකඩගල	26
		මාතලේ	දඹුල්ල (2022 I කණ්ඩායම)	44
			(2022 II කණ්ඩායම)	72
	වයඹ	කුරුණෑගල	මාවතගම	14
	දකුණ	ගාල්ල	ගාල්ල	24
	සබරගමුව	කෑගල්ල	කෑගල්ල	25
	ඌව	බදුල්ල	බණ්ඩාරවෙල	16
	බස්නාහිර	ගම්පහ	කටුනායක	20
පාඨමාලාව හදාරනු ලබන පුහුණු ලාභීන් ප්‍රමාණය				**241**
කොරියන් භාෂාව	වයඹ	පුත්තලම	වෙන්නප්පුව	10
පාඨමාලාව හදාරනු ලබන පුහුණු ලාභීන් ප්‍රමාණය				**10**
මුළු එකතුව				**628**

කර්නල් දර්ශන රත්නායක ආර්ඩබ්ලිපී ආර්එස්පී

සභාපති

ජාතික යොවුන් සේනාංකය